# නියමුවා


> “සතුරා අපට වියරු ලෙස පහර දෙන්නේ නම්ද, එකම එක යහ ගුණයක් හෝ නැතිව, හොඳටම කළු කොට අප සිත්තම් කරන්නේ නම්ද, එය වඩාත් හොඳය. අප සතුරාත් අපත් අතර පැහැදිලි වෙන්කිරීමේ ඉරක් ඇඳ තිබෙන බව පමණක් නොව, අප අපේ වැඩවලදී බොහෝ දේ මුදුන්පත් කර තිබෙන බවද එයින් පෙනී යයි.”
>
> මාඕ සේතුං
> තෝරාගත් ලිපි,
> *143 පිටුව*


ISSN 1391 - 1031 | 2023 නොවැම්බර් | 28 වෙළුම | 03 කලාපය | ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත | පුවත්පතක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී | ආධාරය රු 100/=




**1989 - 2023**

ඒ කඳු මුදුනතින් නැගී
සහෝදරත්වයේ උල්පතට
ලියන්නෙමු නැවත කවියක්

දුර්භාග්‍යයය තවදුරටත්
ඇවිද යයි නිම්න ගම්බිම් මත
පීඩාව මහෝඝයක් වී
පෙළයි දවයි හඬවයි මහමුහුද සේ

අහර නැති දරුවෝ
ඉකිගසා හඬති උදෑසන ගෙවල
වියපත් වැඩිහිටියෝ
අහුලති ඉඳුල් බඳුන්වල

විරැකියා මන්දපෝෂණ
බෙහෙත් නැති ඉස්පිරිතාල
ආත්මාර්ථයේ ගිල්වූ
මිනිස් නොමිනිස් කෙදිරිලි
මරණය තිබේ හැම දොර

ඉදින් ලියනෙමු කවියක්
කිසිදාක ගිලා නොබසින
ජන හදෙහි පැන නැගී
සහෝදරත්වයේ මහ කන්දට

කඳු පතුල ඉපිද
කඳු මුදුනතට නැග
සිවි දිගට ගලා ගිය
රතුම රතු හදවතට

සිවි දිගට ගැලූ
දිය උල්පත්වලට
මිනිසත්කමේ ගුණ සුවඳ
හුස්ම තැවරූ
රතු හදවත්වලට

හදවතෙහි ගැඹුරින්
විප්ලවය පැන නැගිය යුතු බව
පතුලෙහි ඇති හේතුවම
උදුරා දමන තුරු
පවතින බව අර්බුදය
උගත්තෙමු අපි ඔබෙන්

මේ මහා කන්ද මත
රතු මල් පිපෙන යුගයයි
වසන්තය හොයාගෙන
කොවුලන් ගයන යුගයයි

ඉල්මහේ ගනඳුරෙහි
ගමන දැන් දැන් නිමයි
වසන්තය නුදුරෙදිම
අරුත නුඹ නුඹම මයි

*(35වැනි ඉල්මහ විරු සමරුව වෙනුවෙනි)*



චේ දින සැමරුම විහාරමහදේවී උද්‍යානය - 2023.10.08

# NPPයේ ජනප්‍රසාදය ඉහළට

# සතුරු බලවේග වියරුවෙන්

ජාතික ජන බලවේගය කෙරෙහි ජනතාවගේ සහයෝගය සීඝ්‍රයෙන් ඉහළ නගිමින් ඇති බව මෑත කාලීන ජනමත සමීක්ෂණ කිහිපයකින්ම අනාවරණය වීමත් බිම් මට්ටමේ ජාතික ජන බලවේගයේ සංවිධාන කටයුතු සාර්ථකව ඉදිරියට යාමත් හමුවේ ආණ්ඩුවේ සහ සාම්ප්‍රදායික විපක්ෂ කණ්ඩායම් වියරු වැටී තිබීම දේශපාලන ක්ෂේත්‍රයේ දැඩි සංවාදයක් නිර්මාණය කර තිබේ.

විශේෂයෙන් එක්සත් ජනපදයේ වෙසෙන ශ්‍රී ලාංකිකයන් වෙනුවෙන් එහි ජාතික ජන බලවේගයේ එක්සත් ජනපද කමිටුව විසින් ලොස් ඇන්ජලීස්, හූස්ටන්, බොස්ටන්, වොෂින්ටන් සහ නිව්යෝර්ක් ඇතුළු නගර ගණනාවක සංවිධානය කරන ලද අනුර දිසානායක සහෝදරයා සහභාගි වූ රැස්වීම් විශාල ජන සහභාගිත්වයක් සහිතව අතිශය සාර්ථක වීමත් මෙම සතුරු කණ්ඩායම්වල ජාතික ජන බලවේගය අරභයා වූ වියරු හැසිරීම තීව්‍ර කරවීමට හේතු වී ඇතැයි විශ්වාස කෙරේ.

එම සංචාරය අතරතුර අනුර දිසානායක සහෝදරයා ශ්‍රී ලාංකිකයින් සේවය කරන පර්යේෂණ ආයතන ඇතුළු අනාගත ආර්ථික සැලසුමකට වැදගත් විය හැකි ස්ථාන කිහිපයක්ම නිරීක්ෂණය කිරීමටද අවස්ථාව උදා කර ගෙන තිබිණි. ආණ්ඩුවේ හෝ සාම්ප්‍රදායික විපක්ෂයේ කිසිදු නායකයෙකුට විදේශයන්හි වෙසෙන ශ්‍රී ලාංකිකයන් හමුවේ සාර්ථක රැස්වීම් සංවිධානය කර ගත නොහැකි වී තිබීමත් ඔවුන්ගෙන් එවැනි පිළිගැනීමක් නොලැබී තිබීමත් විශේෂයකි. මෙම තත්වය හමුවේ මෙම සතුරු කණ්ඩායම් කෙරෙන් පළ වන වියරුවම ජාතික ජන බලවේගය ජයග්‍රාහී මාවතට පිවිස ඇති බවට සාක්ෂියක් වන බව දේශපාලන විචාරකයින්ගේ අදහස වී ඇත.

විශේෂයෙන් දේශපාලන විචාරකයන් සහ බුද්ධිමතුන් ගණනාවක් සමාජ මාධ්‍ය ඔස්සේ අදහස් පළ කරමින් මේ හා සමාන අදහස් ගෙනහැර දක්වා තිබූ අතර ආණ්ඩුවේ සහ සාම්ප්‍රදායික විපක්ෂයේ නායකයින් විසින් විශේෂ මාධ්‍ය හමු පවත්වමින්ද ඔවුන්ගේ කුලී මාධ්‍ය ඒකක පාවිච්චි කර ගනිමින්ද ජාතික ජන බලවේගය සහ නායක අනුර දිසානායක සහෝදරයාට එරෙහිව වියරු මඩ අවලාද ප්‍රහාර තීව්‍ර කර තිබිණි.

මේ තත්වය පිළිබඳව නියමුවා විසින් කරන ලද විමසුමකට පිළිතුරු දෙමින් ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා ප්‍රකාශ කළේ රටේ පවතින ආර්ථික අර්බුදයෙන් හා බදු හා ගාස්තු ඉහළ දමා ආණ්ඩුව විසින් අර්බුදය මුළුමනින්ම ***11 වැනි පිටුවට***

## 03 ඡන්දෙට අටවන..




විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමට නොව එම ධුරයේ බලතල තරමක් අඩුකිරීමට පවා එකඟ නොවුණු, තමන් බලයේ සිටින සෑම විටම 18වැනි හා 20වැනි සංශෝධන මගින් බලය වැඩිකර ගත් රාජපක්ෂවරුන්ට විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමට අවශ්‍ය වීමම...

## 05 එකම සටනක්...

මහ බැංකුවට වඩා වටිනා අපේ ජල බැංකුවට සුද්දය දෙන්නයි මේ සූදානම් වෙන්නේ. මහ බැංකුවට සුද්දය දීපු මිනිහා ජල බැංකුවටත් අත තියන්නයි හදන්නේ. අපි ඒකට කිසිසේත්ම ඉඩ දෙන්නේ නැහැ. ජල විදුලියට, ගෘහස්ථ ජලයට වගේම....



## 09 ඉතිහාසයේ නොමැකෙන...

පාලකයන් විසින් සිදු කළ මහා මිනිස් ඝාතන, පක්ෂ තහනම් කිරීම්, මැර ක්‍රියා සියල්ල සඟවා, සටන් කළ අය ඝාතකයින් ලෙස, ත්‍රස්තවාදීන් ලෙස නම් කරන ලදී. අපේ රටේ සමහරු තවමත් සිටින්නේ ජයවර්ධනලා ලියූ ...




තරුණ.................................... 04
ජාත්‍යන්තර.......................... 06
ආර්ථිකය ............................ 07
කාන්තා.................................. 08
විශේෂාංග.......................... 10
වේදිකාව.................................11


***යුක්තිගරුක දේශයක්!    සාධාරණ සමාජයක්!!    නිවහල් මිනිසෙක්!!!***

# රු.20,000ක් ඉල්ලා රාජ්‍ය සේවකයෝ රට පුරා විරෝධතා



සියලු රාජ්‍ය සේවකයින්ට රු. 20,000ක අවම දීමනාවක් ලබාදීම යන මූලික ඉල්ලීම සඳහා ආණ්ඩුවට බලකරමින් රාජ්‍ය හා පළාත් රාජ්‍ය සේවා වෘත්තීය සමිති එකතුව ඔක්තොම්බර් 30 දහවල් රට පුරා රාජ්‍ය ආයතන 300 ක පමණ විරෝධතා උද්ඝෝෂණ පැවැත්විය. කොළඹ නගරයේ සෙත්සිරිපාය, නාරාහේන්පිට, ටවුන්හෝල් ඇතුළුව රට පුරා දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල කේන්ද්‍ර කරගනිමින් විවිධ නගරයන්හි මෙම විරෝධතා පවත්වනු ලැබිණි.

මෙම විරෝධතාවයන් සඳහා සංවර්ධන නිලධාරී/ කළමනාකරණ සේවා නිලධාරී/ ග්‍රාම නිලධාරී/ සමෘද්ධි/ කාර්යාල සේවා/කෘෂිකර්ම උපදේශක සේවය/කම්කරු නිලධාරි ඇතුළු පළාත් රාජ්‍ය සේවා සේවා ගණනාවක් ඒකාබද්ධව මෙම උද්ඝෝෂණ පැවැත්වූ බව එම විරෝධතාවය සඳහා එක් වූ සංවර්ධන නිලධාරී සේවා සංගමයේ ප්‍රධාන ලේකම් චන්දන සූරියආරච්චි සහෝදරයා නියමුවා වෙත පැවසීය.

# ලියන, කියන නිදහසට බැරියර් එපා... ඔන්ලයින් පෙත්සමකට අත්සන්



ආණ්ඩුව විසින් ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් මර්දනය කරමින් සහ නිදහස අහුරමින් ගෙන එන සමාජ මාධ්‍ය නියාමන පනතට එරෙහිව ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානය මගින් විරෝධතා ක්‍රියාමාර්ග අරඹා ඇති අතර එහි එක් පියවරක් ලෙස පසුගියදා ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථාන පරිශ්‍රයේදී Online පෙත්සමකට අත්සන් තබන ලදී. මෙම අවස්ථාව සඳහා ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා, ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ ජාතික සංවිධායක් වසන්ත සමරසිංහ, සංවර්ධන නිලධාරී සේවා සංගමයේ ප්‍රධාන ලේකම් චන්දන සූරියආරච්චි, රාජ්‍ය කළමණාකරන සේවා නිලධාරීන්ගේ සංගමයේ ප්‍රධාන ලේකම් චන්දිම විමලසුරේන්ද්‍ර, සමස්ත ලංකා සෞඛ්‍ය වෘත්තීය සමිති සම්මේලනයේ සභාපති සමන්ත කෝරළේආරච්චි, හෝටල් සේවක මධ්‍යස්ථානයේ ජාතික සංවිධායක ජයතිලක රණසිංහ ඇතුළු වෘත්තීය සමිති නියෝජිතයෝ සහභාගි වූහ.

# පොලිස් පහරදීමට එරෙහිව රට පුරා ගුරු-විදුහල්පති විරෝධතා




පසුගිය 24 දින අධ්‍යාපන අමාත්‍යාංශය දක්වා විරෝධතා පෙළපාලියකින් පැමිණි ගුරු, විදුහල්පතිවරු, පිරිවෙන් ගුරුවරු ඇතුළු පිරිසට එල්ල කළ ම්ලේච්ඡ ප්‍රහාරයට එරෙහිව පසුගිය 27 දින රට පුරා පාසල් ඉදිරිපිට ගුරු විදුහල්පතිවරු විරෝධතා පැවැත්වූහ.

ගුරු විදුහල්පති වැටුප් විෂමතාවයේ ඉතිරි 2/3 වහා ලබාදෙනු, දරුවන්ගේ අධ්‍යාපන අයිතිය තහවුරු කරනු, දෙමාපියන් මත පටවා තිබෙන අධ්‍යාපනයේ බර ඉවත් කරනු, අධ්‍යාපනයට 6% ක් වෙන්කරනු යන ඉල්ලීම් වෙනුවෙන් ගුරු විදුහල්පතිවරු, පිරිවෙන් ගුරුවරු, පසුගිය ඔක්. 24 දින විරෝධතා පෙළපාලියක් පවත්වා තිබිණි. පැලවත්ත අධ්‍යාපන අමාත්‍යාංශය දක්වා පැමිණි මෙම විරෝධතා පෙළපාලියට පොලිසිය විසින් බැටන් ප්‍රහාර, කඳුළු ගෑස්, ජල ප්‍රහාර සමග පහර දෙන ලද අතර එම බාධක නොතකමින් සියලු ගුරු විදුහල්පතිවරු අධ්‍යාපන අමාත්‍යාංශය දක්වා පෙළපාලියකින් පැමිණ විරෝධතා රැලියක් පැවැත්වූහ.

# සංවර්ධන නිලධාරී සේවා සංගමය දිස්ත්‍රික් සමුළු කැඳවයි



රු.20,000ක අවම දීමනාවක්, තනතුරු උසස්වීම් පටිපාටියක්, MN 04 වැටුප් විෂමතාවයට විසඳුමක්, සාධාරණ හා විද්‍යාත්මක රාජකාරී ක්‍රමවේදයක්, අහිමිකර ඇති පූර්ණ විශ්‍රාම වැටුප් ක්‍රමය, අහිමි කර ඇති විශේෂ කාර්ය සාධන විභාග ක්‍රමය ඇතුළු අයිතීන් දිනා ගැනීම වෙනුවෙන් සංවර්ධන නිලධාරීන් හා ආශ්‍රිත සේවා නිලධාරීන් පෙළගස්වන දිස්ත්‍රික් සමුළු විට රට පුරා දිස්ත්‍රික් ගණනාවක පැවැත්විණි. සංවර්ධන නිලධාරී සේවා සංගමයේ ප්‍රධාන ලේකම් චන්දන සූරියආරච්චි සහෝදරයාගේ ප්‍රධානත්වයෙන් මෙම සමුළු පවත්වනු ලබන අතර මහනුවර, පොළොන්නරුව, ගාල්ල, හම්බන්තොට, මාතර ආදී දිස්ත්‍රික් ගණනාවක පැවැත්වූ සමුළු වෙනුවෙන් විශාල සාමාජික පිරිස් එක්ව සිටියහ.

*ජනතා විමුක්ති පෙරමුණේ මාධ්‍ය හමුව - 2023.10.31*

# ක්‍රෑර යුද්ධය වහා නතර කරන සටන් විරාමයකට එක්සත් ජාතීන් බලපෑම් කළ යුතුයි

**ජනතා විමුක්ති පෙරමුණේ ජාතික සංවිධායක බිමල් රත්නායක සහෝදරයා**

පලස්තීනය තුළ සාමාන්‍ය ජනතාව ඝාතනය කිරීම වහාම නවත්වා ස්වාධීන පලස්තීනයක් සහ ස්වාධීන ඊශ්‍රායලයක් යන දෙරට සම්බන්ධයෙන් එක්සත් ජාතීන්ගේ සංවිධානය පිළිගෙන තිබෙන ප්‍රතිපත්තිය ක්‍රියාවට නැගිය යුතුයි කියන ස්ථාවරයේ ජනතා විමුක්ති පෙරමුණ ආරම්භයේ සිටම ඉන්නවා. 1948දී එක්සත් ජාතීන්ගේ සංවිධානය මැදිහත්වීමෙන් නිදහස් ඊශ්‍රායලය පිහිටුවූවත් නිදහස් පලස්තීනය මේ දක්වා පිහිටුවා නැහැ. දකුණු අප්‍රිකාවේ කළු ජාතිකයන් යටත්විජිකරණයට ලක්කර පීඩාවට පත් කළා සේ පලස්තීන ජනතාව ජීවත් වෙනවා. ඒ තුළ ඇති වුණු ගැටුමෙන් පසුගිය වසර 75 කාලය පුරාම පලස්තීන ජනතාවත් ඊශ්‍රායල ජනතාවත් පීඩා විඳිනවා. විශේෂයෙන්ම පලස්තීනයේ කොටසක් වන ගාසා තීරය තුළ 21වැනි ශත වර්ෂයේ විශාලතම ඛේදජනක යුද්ධය ඊශ්‍රායල ආණ්ඩුව සහ ඇමෙරිකානු ආණ්ඩුව මගින් දියත් කර තිබෙනවා. දස දහස් ගණන් ජනතාව අවතැන් වී දරුවන් ඇතුළු දහස් ගණනක් මියගොස් තිබෙනවා.

ඔක්තෝබර් 07 වැනිදා හමාස් සංවිධානය විසින් ඊශ්‍රායල ජනතාවට එල්ල කළ ප්‍රහාරය සමග බටහිර යුදවාදී මාධ්‍යය ප්‍රචාරය කරමින් සිටින්නේ මේ ගැටලුව ඔක්තෝබර් 07 වැනිදා පටන් ගත්තා කියලයි. නමුත් 1948 සිට ඊශ්‍රායලය ස්වාධීන රාජ්‍යයක් ලෙස එක්සත් ජාතීන්ගේ සංවිධානයෙන් පිළිගත් වහාම අති විශාල පලස්තීන ජනතාවක් ඔවුන්ගේ ගම්වලින් පළවා හැරියා. එදා සිට මේ දක්වා ලෝකයේ විශාලතම අවතැන් ජනතාව හැටියට පලස්තීන ජනතාව සිටිනවා. මිලියන 14යි. එයින් මිලියන 6.9ක් පලස්තීනය තුළ සිටින අතර, බහුතරයක් වූ මිලියන 7.1ක් වෙනත් රටවල් තුළ සරණාගතයන් වී සිටිනවා. එම සරණාගතයින්ගෙන් බහුතරයක් ජෝර්දානය ඇතුළු පලස්තීනය අවට රටවල සිටිනවා. එක්සත් ජාතීන්ගේ සංවිධානය සහ ලෝක බලවතුන් විසින් ඊශ්‍රායලය බිහිකර, පලස්තීන රාජ්‍ය බිහි නොකිරීමෙන් මේ ප්‍රශ්නය වසර 75ක් පුරා ඇදී එනවා.

2007 සිට ඔක්තෝබර් 07දා දක්වා හයදහසකට අධික පලස්තීනුවන් සංඛ්‍යාවක් ද සිය ගණනක් ඊශ්‍රායල් ජාතිකයන්ද ඝාතනය වී තිබෙනවා. ඒ කාලය තුළ පලස්තීනුවන්ට අයිති ගම්මාන 170ක් පමණ ඊශ්‍රායලයට ඈඳාගෙන තිබෙනවා. ඒ ගම්වල සිටි පලස්තීන ජනතාව පළවා හැරියා. ගාසා තීරය ඩෝසර් කරමින් 8500කට අධික දරුවන් ඇතුළු ජනතාව මිය යාම ගැන ඇමෙරිකන් ජනාධිපති, ඊශ්‍රායල් අගමැති ඇතුළු යුධවාදීන් මිය යන සියලු දෙනා ත්‍රස්තවාදීන් ලෙස නම්කර තිබෙනවා. නමුත් බටහිර රටවලින් නිර්මාණය කළ Save the Children ස්වේච්ඡා සංවිධානය හෙළි කර තිබෙන්නේ සති තුනක් තුළ ගාසා තීරයේ මිය ගිය දරුවන් ප්‍රමාණය වසර පහක් තුළ ලෝකයේ යුද ගැටුම්වලින් මිය ගිය දරුවන් සංඛ්‍යාවට වඩා වැඩි බවයි. මේ මිය යන්නේ සටන්කාමීන් නොව දරුවන් බව මේ සංවිධානයෙන් අවධාරණ කර තිබෙනවා. ඒ වගේම එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහා ලේකම්වරයා සහ එම සංවිධානය විසින්ම නිකුත් කළ නිවේදනයක දැක්වෙන්නේ ඔක්තෝබර් 29 වැනිදා එක්සත් ජාතීන්ගේ කාර්යාලයේ ධජය අඩකුඹු කර ශෝක දිනයක් ප්‍රකාශයට පත්කර තිබූ බවයි.

යුදවාදීන් මේ ප්‍රශ්නය ඉස්ලාම්, ක්‍රිස්තියානි, යුදෙව් ගැටුමක් ලෙස අර්ථකථනය කරන්න උත්සාහ කරන නමුත් අවුරුදු සියයකට වඩා පැරණි ක්‍රිස්තියානි දේවස්ථාන පවා ඊශ්‍රායල් ප්‍රහාරයෙන් විනාශ කර තිබෙනවා. ඊශ්‍රායලයේ තිබෙන ආණ්ඩුව සියෝන්වාදී ජාතිවාදී කණ්ඩායමක් බව ලොව පුරා සිටින යුදෙව් ජනතාව හඬගා කියමින් යුදෙව්වන්ගේ නාමයෙන් ගෙන යන මේ ප්‍රහාර නතර කරන ලෙස බලපෑම් කරමින් සිටිනවා. යුදෙව්වන් විසින්ම සියෝන්වාදී ජාතිවාදී කණ්ඩායමට එරෙහිව පෙන්වන මානවවාදී ගුණය සම්බන්ධයෙන් අපි අගය කරනවා. නිදහස් පලස්තීනයක් ඇති කළ යුතුයි කියන ස්ථාවරයේ වතිකානුවත් සිටිනවා. මෙතැන ඉස්ලාම් ක්‍රිස්තියානි ගැටුමක් නැති බවත් ඇමෙරිකාව ප්‍රමුඛ යුදවාදීන්ගේ මැදිහත්වීමක් තිබෙන බවත් ප්‍රකාශ කර තිබෙනවා. ඊශ්‍රායලය විසින් අද ක්‍රියාත්මක කරන්නේ දකුණු අප්‍රිකාව තුළ තිබුණු වර්ණ භේදවාදයටත් වඩා ම්ලේච්ඡ සංහාරයක් බව පිළිගන්නා ලෝකයේ රටවල් අතරට වතිකානුවත් ඇතුළත් වෙනවා. ආගමික ප්‍රශ්නයක් මත යුද්ධයක් සිදුනොවන බව ලොව පුරා ප්‍රගතිශීලීන් පිළිගෙන තිබෙනවා. පාප් වහන්සේ සහ වතිකානුවත් ඒ ස්ථාවරය දරනවා.

අවස්ථාවාදී දෘෂ්ටි කෝණයෙන් නොව මානවවාදී දෘෂ්ටි කෝණයෙන් බලා ජනතා විමුක්ති පෙරමුණේ ස්ථාවරය ගොඩනඟාගෙන තිබෙනවා. එක්සත් ජාතීන්ගේ සංවිධානයට ඉදිරිපත් කළ යෝජනාවකින් ආරක්ෂක මණ්ඩලයේ රටවල් 15න් 11ක් සටන් විරාමයකට යන යෝජනාවක් අනුමත කළා. නමුත් එක්සත් ජනපදයේ නිශේධ බලය පාවිච්චි කර සටන් විරාම යෝජනාව පරාජයට පත් කළා. ඉන්පසුව එක්සත් ජාතීන්ගේ සංවිධානය තුළ මහා මණ්ඩලයේදී සටන් විරාම යෝජනාවක් සම්මත කළා. එයට රටවල් 120ක් පක්ෂ වී රටවල් 14ක් විරුද්ධ වී රටවල් හතළිස් ගණනක් ඡන්දය දීමෙන් වැළකී සිටියා. ලෝකයේ අති බහුතරයක් රටවල් යුධවාදයට විරුද්ධව මෙය නතර කළ යුතුයි කියන ස්ථාවරයේ සිටිනවා. සටන් විරාමයට පක්ෂව ශ්‍රී ලංකාවේ විදේශ අමාත්‍යාංශයත් ඡන්දය පාවිච්චි කිරීම ගැන අපි අගය කරනවා.

මේ යුද්ධය නිසා ශ්‍රී ලංකාවෙන් ඊශ්‍රායලයේ සේවයට ගොස් සිටියදී මියගිය අනුලා රත්නායක සම්බන්ධයෙන් ශ්‍රී ලාංකිකයන් වශයෙන් වගේම පක්ෂයක් වශයෙනුත් කණගාටුවට පත්වෙනවා. ඊශ්‍රායලය තුළ රැකියා කරන ශ්‍රී ලාංකිකයන්ගේ ආරක්ෂාව තහවුරු කිරීමට ලංකා ආණ්ඩුව ක්‍රියාකළ යුතුයි. ගාසා තීරයේ සිට බටහිර ඉවුරේ සරණාගත කඳවුරුවලට පවා බෝම්බ හෙළමින් තිබෙන වටපිටාවක සේවය කරන ශ්‍රී ලාංකිකයන් සම්බන්ධයෙන් සොයා බැලිය යුතුයි. මේ අනාරක්ෂිත තත්වය යටතේ ඊශ්‍රායලය තුළ රැකියා ලබාදෙන්න ඇතැම් ව්‍යාපාරික ආයතන කටයුතු කරනවා. ව්‍යාපාරික වුවමනාවන් වෙනුවෙන් අනාරක්ෂිත ප්‍රදේශවලට ශ්‍රී ලාංකිකයන් යැවීම වැළැක්වීමට ආණ්ඩුව කටයුතු කළ යුතුයි. මේ ගැටලුවට විසඳුම් සෙවීම සම්බන්ධයෙන් අපේ ස්ථාවරය වී තිබෙන්නේ පලස්තීනය සහ ඊශ්‍රායලය යනු දෙරටේම ජනතාව පිළිගන්නා විසඳුමක් සෙවිය යුතු බවයි. මේ ප්‍රශ්නය නිර්මාණය කළ එක්සත් ජාතීන්ගේ සංවිධානයට මෙය නිරාකරණය කිරීමේ මූලික වගකීමක් තිබෙන බවත් අවධාරණය කළ යුතුයි. අද තිබෙන නිදහස් ඊශ්‍රායලය රාජ්‍යය වගේම නිදහස් පලස්තීන රාජ්‍යයක් පැවතිය යුතුයි කියන ස්ථාවරය අපි අවධාරණය කරනවා. ජනතාවගේ ජීවිත ආරක්ෂා කර ගැනීමට ලෝක පරිමාණයෙන් සිදුවන මැදිහත්වීමේ කොටස්කරුවන් බවට අපිත් එකතු වෙනවා.

# යුද්ධය පිළිබඳ තීන්දු ගැනීමට දායක නොවූ ජනතාව හැමදාමත් පීඩාවට පත්වුණා

**ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම කමිටු සාමාජික වෛද්‍ය නලින්ද ජයතිස්ස සහෝදරයා**

යුද්ධයක් කියන්නේම ඛේදවාචකයක්. යුද්ධය සම්බන්ධයෙන් තීන්දු ගැනීමට දායක නොවුණු ජනතාව හැමදාමත් පීඩාවට පත්වුණා. මේ වෙනවිට 8,000කට අධික පිරිසකගේ ජීවිත අහිමි වී ජීවත්ව සිටින්නන්ගේ ආහාර, ජලය ඇතුළු මූලික අවශ්‍යතා සපුරා ගැනීමට නොහැකි වී සිටිනවා. අද බංකොලොත් රටක් වී තිබුණත් ලංකාව රටක් හැටියට සාධාරණත්වය වෙනුවෙන් ලෝකය ඉදිරියේ ගත් ක්‍රියාමාර්ග නිසා ඒ ගෞරවය අදත් හිමි වී තිබෙනවා. දෙවන ලෝක යුද්ධයෙන් පසුව එක්සත් ජාතීන්ගේ සංවිධානය ගොඩනැගුවේම මෙවැනි තීරණාත්මක ගැටුම්වලදී මැදිහත් වී ලෝකයේ ජනතාවට සාධාරණත්වය ඉෂ්ට කරන්නයි. එක්සත් ජාතීන්ගේ සංවිධානය ඒ වෙනුවෙන් මෙම ගැටුමේදී පවා නිකුත් කරන ප්‍රකාශ සම්බන්ධයෙන් අපේ ඇගයීමක් තිබෙනවා.

අවසන් වශයෙන් ගැටුමට මුල පිරුවේ කවුද යන්න සොයනවාට වඩා කාලයක් පුරා පවතින මේ ප්‍රශ්නයට විසඳුම් සෙවිය යුතු බව එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහා ලේකම්වරයා කර තිබෙන ප්‍රකාශය ජනතා විමුක්ති පෙරමුණේ විශේෂ ඇගයීමට ලක්වෙනවා. ලෝකයේ මෙවැනි රටවල මනුෂ්‍යත්වය පිළිබඳව කල්පනා කරන ජනතාව මේ ගැටුම නිරාකරණය කිරීමට හඬ නැගීම ඇගයීමට ලක්කරන අතර එහි කොටස්කරුවන් වෙන්නත් අපි ක්‍රියාකරනවා. යුද්ධයට එරෙහිව යුදෙව් ජනතාව ගෙන තිබෙන ස්ථාවරයත් අපි අගය කරනවා. නිදහස් ඊශ්‍රායලය සහ නිදහස් පලස්තීනය සම්බන්ධයෙන් එක්සත් ජාතීන්ගේ ස්ථාවරය අනුව ක්‍රියාකරමින් එක්සත් ජාතීන්ගේ සංවිධානය සම්මත කරගත් සටන් විරාමයට ඉක්මනින්ම යා යුතු බව අපි අවධාරණය කරනවා.

නියමුවා
ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත
464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com

# ජනාධිපතිගේ ස්මාර්ට් රට හා ගොංපාට් වැඩ

ජනාධිපති රනිල් වික්‍රමසිංහ පසුගිය ඔක්තෝබර් 21දා කොළඹ සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගණයේදී සිය පක්ෂයේ ජාතික සමුළුව පැවැත්වීය. ශාලාවේ පුටු ටික පිරෙන්නටවත් පිරිස ගෙන්වා ගැනීමට නොහැකි වූ රනිල් වික්‍රමසිංහ සමුළුවට පැමිණි පාක්ෂිකයන් අමතමින් කිවුවේ ස්මාර්ට් රටක් ගොඩනැගීමට එ.ජා.ප.ය ස්මාර්ට් පක්ෂයක් ලෙස ගොඩනැගිය යුතු බවය.

සමුළුව ඇමතූ පාක්ෂිකයන් කිහිපදෙනෙක් ස්මාර්ට් රටක් හැදීම ගැන කථා කළහ. ඒ 'ස්මාර්ට්' යන වචනය නූතන තරුණ පරපුර 'ඇන්දවීමට' යොදාගත හැකි හොඳම වචනය යැයි ඔවුන් සිතන නිසා විය යුතුය.

රනිල් වික්‍රමසිංහලා ස්මාර්ට් රටක් ගැන කථා කළද ඔවුන්ගේ කෙරුවාව නම් අන්තිම 'ගොංපාට්ය'. රනිල් වික්‍රමසිංහ සමුළුවට පැමිණ තිබුණේ නුවරඑළියට යන්නාක් මෙන් 'ලෙදර් ජැකට්' එකක් ඇඳගෙනය. තමන් කැමති ඇඳුමක් ඇඳීමට ඔහුට ඇති අයිතිය අනුව එය පසක තැබුවත් ජනාධිපතිවරයා ලෙස මේ මොහොතේ ඔහු කරමින් සිටින කථා හෝ වැඩ කිසිවක් ස්මාර්ට් නැත. ඔහුගේ කථා ගොංපාට්ය. වැඩ ගෝත්‍රිකය.

ස්මාර්ට් කථාව අස්සේ රනිල් ඩිජිටල් යුගයක් ගැනද කථා කළේය. එහෙත් ඒ රනිල්ම සමාජ මාධ්‍ය පාලනය කරන, සමාජ මාධ්‍යවල නිදහස් අදහස් පලකරන අය දඩයම් කරන පනතක් පාර්ලිමේන්තුවට ගෙනවිත් තිබේ. එම පනත සම්මත වුවහොත් රට ගමන්කරන්නේ ඩිජිටල් යුගයකට නොව ගල් යුගයටය. රටක පුරවැසියන්ගේ, විශේෂයෙන් තරුණ පරපුරේ ලියන කියන නිදහසට සීමා දැමීමට පනත් ගෙනෙන රනිල්ම ස්මාර්ට් රටක් ගැන දෙඩවීම විහිළුවකි. අදහස් පළකිරීමට වාරණ දමා, අදහස් පළකරන අය දඬුකඳේ ගසා තනන ස්මාර්ට් රට කුමක් දැයි, ඩිජිටල් යුගය කුමක් දැයි රනිල්ගෙන්ම ඇසිය යුතුය.

ඒ අතර ආණ්ඩුව පසුගියදා මේ වසර තුළ තුන්වන වරටත් විදුලිය ගාස්තු වැඩිකළේය. ඒ ඇමතිවරයාම කියන පරිදි ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ කොන්දේසි පිළිපැදීම සඳහාය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ඉදිරියේ දණින් වැටී ජනතාව මත බර පටවමින් ගොඩනැගිය හැක්කේ ස්මාර්ට් රටක් නොව වහල් දේශයකි. රනිල් දැන් පණපොවන්නේ වහල් වෙළෙන්දාගේ භූමිකාවටය.

දැන් ජනතාවට තවදුරටත් මේ විදුලිය බිල දරාගත නොහැකි බව ඉතා පැහැදිලිය. විදුලි බිල 18%කින් වැඩිකරන බව කීවද සත්‍ය ලෙස වැඩිවන ප්‍රමාණය ඊට වැඩිය. විදුලිය ගාස්තුවට අමතරව ස්ථාවර ගාස්තුවද වැඩිකර තිබේ. මෙහි ප්‍රතිඵලය වන්නේ කුමක්ද? මේ වනවිට වැසී යමින් පවතින දේශීය කර්මාන්ත සියල්ල වැසීයාමය; ව්‍යාපාර කඩාවැටීමය.

මේ වනවිට කර්මාන්තශාලා හා සේවා ස්ථාන 2000ක් පමණ වැසී ඇති බවත් ණය ගෙවීමට අසමත් වූ කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර 556ක් බැංකුවලට සින්න වී ඇති බවත් පසුගිය දිනවල ජනමාධ්‍ය විසින් වාර්තා කරනු ලැබ තිබිණි. අලුත් විදුලි බිලත් සමග මේ තත්වය තව තවත් දරුණු වනු ඇත. කර්මාන්ත, ව්‍යාපාර වසාදැමීමට ඉඩ සලසමින් රැකියා අහිමි කරමින් ගොඩනගන ස්මාර්ට් රට කෙසේදැයි සිතා බැලිය යුතුය. මේ කථා ගොංපාට් වන්නේ ඒ නිසාය.

විදුලිය බිල ඉහළ යාමත් සමග කර්මාන්ත, ව්‍යාපාර බිඳවැටීමට අමතරව ගෘහයන් තුළද අර්බුද මතුවේ. මේ තත්වය තුළ ජනතාවට නිවසේ 'රයිස් කුකරය' පසෙක තබා දර ලිපට මාරුවීමත් ඇඳුම් මදින්නේ නැතිව ඇඳගෙන යාමටත් සිදුවනු ඇත. (මෙලෙස ගියොත් ඇඳුම් නැතිවම යාමටද සිදුවනු ඇත.) රයිස් කුකරයෙන් දර ලිපට මාරුවීම රනිල්ට අනුව ස්මාර්ට් වේ! විදුලි උපකරණ පාවිච්චි නොකර සිටීම ස්මාර්ට් රටක ලක්ෂණයක් ලෙස ඔවුන් සිතනවාද?

මේ විදුලිය බිල ඉහළ දමන්නේත් දුරකථන ගාස්තු හා ඩේටා ගාස්තු දරාගත නොහැකි මට්ටමකට පසුගිය කාලය පුරා රැගෙනවිත් තිබෙන්නේත් නොමිලේ වයි ෆයි කලාප ඇතිකිරීමට වරක් කථා කළ රනිල් වික්‍රමසිංහමය. රනිල් වික්‍රමසිංහලා සමාජයේ මේ මොහොතේ පවතින ලස්සන නූතන වචන වේදිකාවල තොරොම්බල් කළද ඇත්තටම සිදුකරමින් සිටින්නේ රට ගල් යුගයට රැගෙන යාමය.

මූල්‍ය අරමුදලේ ණයක් වෙනුවෙන් රටේ සම්පත් සියල්ල විකුණා දමන විදුලිය බිල දරාගත නොහැකි ලෙස වැඩි කරන, ඒ පිළිබඳ පළ කරන විරෝධයන්, අදහස් වැළැක්වීමට ජනමාධ්‍ය මර්දනය කරන පනත් ගෙනමින්, ත්‍රස්තවාදය වැළැක්වීමට යැයි නව පනත් සකසන රනිල් වික්‍රමසිංහලාගේ ස්මාර්ට් රට ජනතාවට ස්මාර්ට් වන්නේ නැත.

එබැවින් ස්මාර්ට් රටක් ගැන කියන මේ ගොංපාට් කථාවලට ජනතාව රැවටිය යුතු නැත. රට පාවා දෙමින් ගල් යුගයට ඇදගෙන යාමට රනිල් වික්‍රමසිංහලා දරන උත්සාහය වහාම පැරදවිය යුතුය. සැබෑ ලෙසම ස්මාර්ට් රටක් ගැන සිතන අය සියල්ලට පළමුව වසර 75ක් තිස්සේ රට බංකොලොත් කළ රට ආපස්සට ගෙනගිය මේ හොර නඩ සියල්ල පැරදවීමට පෙරමුණ ගත යුතුය.

# ඡන්දෙට අටවන රනිල්-රාජපක්ෂ උගුල්

රනිල් වික්‍රමසිංහ ලංකාවේ අටවන විධායක ජනාධිපතිවරයාය. සැබැවින්ම ඔහු ජනවරමකින් පත්වූ ජනාධිපති නොව ව්‍යවස්ථාවට අනුව "අටවන ලද" ජනාධිපතිය. මේ වනවිට ඔහු උගුල් අටවන ජනාධිපතිවරයා බවටද පත්වෙමින් තිබේ. ඒ ඡන්ද නොපවත්වා සිටීමට ව්‍යවස්ථා උගුල් ඇටවීම නිසාය.


මේ වසරේ පෙබරවාරි අග පැවත්වීමට නියමිතව තිබූ පළාත් පාලන ඡන්දය තවමත් පවත්වන දිනයක් නැතිවම කල්ගොස් තිබේ. ඒ, එම ඡන්දයේ ප්‍රතිඵලය රනිල්ගේ 'ජනාධිපති සිහිනයට' මාරාන්තික හානියක් විය හැකි බව ඔහු දන්නා නිසාය. එම ඡන්දය නොපවත්වා සිටීමට ඔහු ඇටවූ උගුල වූයේ මුදල් නැතැයි පවසා මැතිවරණ කටයුතුවලට මුදල් වෙන්නොකර සිටීමය. මේ පිළිබඳ අධිකරණ ක්‍රියාමාර්ගද පවතින අතර ඒවාද අවසන් නොවී තිබේ.

දැන් ලබන වසරේ පැවැත්වීමට නියමිත ජනාධිපතිවරණය නොපවත්වා සිටීම සඳහා ව්‍යවස්ථා ගැටයක් ගැසීමේ උත්සාහයක් පිළිබඳවද අදහස් පළවේ. මෙවර මේ සඳහා පෙරමුණ ගෙන තිබෙන්නේ පොහොට්ටුවේ බැසිල් ඇතුළු නායකයින්ය. අවසාන මොහොතේ තම පරාජය ස්ථිර බව දැණුන විට රනිල්ටද තිබෙන්නේ මෙම ගැටයේ පිහිටය.

ඉදිරි වසර දෙක තුළ රටේ ඡන්දයක් නැතැයි රනිල් - රාජපක්ෂ නඩ දෙකේම ප්‍රබලයන් දැන් දොඩවන්නට පටන්ගෙන තිබේ. ඉන් ඉතාම හොඳින් පැහැදිලි වන්නේ ඔවුන් ඡන්දවලට බියෙන් පසුවන බවය. ඒ නිසා උපරිම කාලයක් ඡන්දවලට මුහුණ නොදී ඡන්ද මගහැර සිටීමට ඔවුන් කැමතිය. ජනාධිපතිවරණය නොපවත්වා සිටීමට ඔවුන් සිතන්නේ ඒ නිසාය.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට හා ඡන්ද නීතිවලට අනුව පළාත් පාලන ඡන්ද හා පළාත් සභා ඡන්ද නොපවත්වා සිටීමට මොවුනට හැකිය. ඒ මහජන නියෝජිතයන් නොමැතිව වුවද ඉහත ආයතන පවත්වාගෙන යාමට අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන තිබෙන නිසාය. එහෙත් ජනාධිපතිවරණය හා මහමැතිවරණය එසේ කළ නොහැක. ඒවා අනිවාර්යයෙන් නියමිත කලට පැවැත්විය යුතුය. මෙහිදී මහ මැතිවරණය සඳහා 2025 වනතුරු කල් තිබේ. එහෙත් ජනාධිපතිවරණය ලබන වසරේ ඔක්තෝබර් මස මැද පැවැත්විය යුතුමය.

මෙම ජනාධිපතිවරණය අපේ රටේ බලය ප්‍රභූ පාලක පැලැන්තියෙන් පොදු ජනතාව අතට මාරු වන තීරණාත්මක ජනාධිපතිවරණයක් වන බවට සැක නැත. ජනවරම ගොඩනැගෙමින් තිබෙන්නේ රාජපක්ෂලාට හා රනිල්ලාට අවාසි ලෙසත් මාලිමාවට වාසිදායක ලෙසත්ය. ජනාධිපතිවරණය පැවැත්වුවහොත් තමන්ට අන්ත පරාජයක් උරුම වන බව පොහොට්ටු නායකයෝ දනිති.




එබැවින් ජනාධිපතිවරණය නොපවත්වා යා යුතුය. එහෙත් ව්‍යවස්ථාව අනුව එය කල්දැමිය නොහැක. අවසානයේ විධායක ක්‍රමය අහෝසි කිරීමට පොහොට්ටුවේ යෝජනාව එන්නේ මේ තත්වය තුළය.

විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමට නොව එම ධුරයේ බලතල තරමක් අඩුකිරීමට පවා එකඟ නොවුණු, තමන් බලයේ සිටින සෑම විටම 18වැනි හා 20වැනි සංශෝධන මගින් බලය වැඩිකර ගත් රාජපක්ෂවරුන්ට විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමට අවශ්‍ය වීමම ඉතිහාසයේ සරදමකි. දැන් රාජපක්ෂවරුන් පත්ව සිටින්නේ 'මිදි ඇඹුලයි කී නරියාගේ' තත්වයටය. ඒ, තමන්ට ජයගත නොහැකි විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමට සිතීමය. ඒ හරහා ජනාධිපතිවරණයට මුහුණ නොදී සිටීමට ඔවුන් කල්පනා කරන බව පෙනේ.

ඉදිරි වසර දෙක තුළ ඡන්ද පැවැත්වෙන්නේ නැතැයි ඔවුන් පවසන්නේ මෙම උපකල්පනයට අනුවය. එනම් ලබන වසරේ ජනාධිපතිවරණය පවත්වනවා වෙනුවට විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කොට එම බලතලද වර්තමාන ආණ්ඩුවට පවරාගත් විට 2025 දක්වා විධායක බලයද සහිතව මෙම පාර්ලිමේන්තුව හා ආණ්ඩුව පවත්වාගෙන යා හැකියැයි ඔවුන් සිතන බව පෙනේ. වසර දෙකක් ඡන්ද නැත්තේ එම තර්කයට අනුවය.

එහෙත් දේශපාලනයේ යථාර්ථය ඊට බොහෝ වෙනස්ය. රාජපක්ෂවරුන්ට හෝ රනිල්ට ලබන වසරේ ඡන්ද නොපවත්වා යා නොහැක. මන්ද ඔවුන්ගේ ව්‍යවස්ථා ගැටය ලිහන ක්‍රමය දැනටමත් මාලිමාව ප්‍රසිද්ධියේ ප්‍රකාශ කර ඇති නිසාය.

විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමේ ව්‍යවස්ථා සංශෝධනයක් හෝ අලුත් ව්‍යවස්ථාවක් සම්මත වීමට නම් පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක ඡන්දයට අමතරව ජනමත විචාරණයකින්ද එය සම්මත විය යුතුය. පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකේ බලය රාජපක්ෂවරුන්ට ගත හැකි වුවත් ජනමත විචාරණයකදී රටේ ඡන්ද දායකයා ඉතා වැදගත්ය. මේ වනවිට රට තුළ ගොඩනැගී තිබෙන රාජපක්ෂ විරෝධයේ ප්‍රමාණයත් රනිල් විරෝධයේ ප්‍රමාණයත් අනුවම ඔවුනට ජනමත විචාරණයක් තනිව ජයගත නොහැක. එය ඉතා පැහැදිලිය.

> විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමට නොව එම ධුරයේ බලතල තරමක් අඩුකිරීමට පවා එකඟ නොවුණු, තමන් බලයේ සිටින සෑම විටම 18වැනි හා 20වැනි සංශෝධන මගින් බලය වැඩිකර ගත් රාජපක්ෂවරුන්ට විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමට අවශ්‍ය වීමම ඉතිහාසයේ සරදමකි. දැන් රාජපක්ෂවරුන් පත්ව සිටින්නේ 'මිදි ඇඹුලයි කී නරියාගේ' තත්වයටය. ඒ, තමන්ට ජයගත නොහැකි විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමට සිතීමය.


මෙහිදී ඔවුන් සිතන්නේ ජ.වි.පෙ 1978 සිටත්, ජාතික ජන බලවේගය එය පිහිටුවාගත් මොහොතේ සිටත් විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමට සටන් කළ නිසා විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන යෝජනාවකදී ජ.වි.පෙ.ට හා ජා.ජ.බ.ට ඊට අනිවාර්යයෙන් පක්ෂවීමට සිදුවනු ඇති බවය. එහි සත්‍යයක් තිබේ. ඒ අනුව විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම නැමති උගුලට මාලිමාවද හසුකරගත හැකිවනු ඇතැයි ඔවුන් සිතන බව පෙනේ.

එහෙත් එය එසේ සිදුවන්නේ නැත. මන්ද විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමට ජනතාවත්, ජ.වි.පෙත් මාලිමාවත් කැමති වුවත් එම බලතල රාජපක්ෂලා ආණ්ඩු බලය දරන වර්තමාන පාර්ලිමේන්තුවට හෝ ජනබලයක් නැති ජනවරම අහෝසි වූ දූෂිත රාජපක්ෂ පාලනයට පැවරෙනවාට කිසිසේත් එකඟ නොවන නිසාය.

එවිට සිදුවන්නේ කුමක්ද? විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමේ යෝජනාව සමගම විධායක ජනාධිපති ක්‍රමය අහෝසි වන විටම වර්තමාන පාර්ලිමේන්තුවද විසුරුවා හැරෙන බවට යෝජනාවක්ද ඉදිරිපත් වීමය. එම යෝජනාවද සහිතව සකස් වන ව්‍යවස්ථා සංශෝධනය ජනමත විචාරණයෙන් ජයගෙන විධායක ජනාධිපති ක්‍රමය අහෝසි වන විටම පාර්ලිමේන්තුවද විසිර වී අලුතෙන් මහජන ඡන්දයෙන් නව පාර්ලිමේන්තුවක් පත්කර ගැනීමට සිදුවේ. එවිට ලබන වසරේ මහ මැතිවරණයක් පැමිණේ. විධායක බලතල පැවරෙන්නේ එම ජනවරමකින් පත්වන නව පාර්ලිමේන්තුවට හා නව ආණ්ඩුවටය.

එසේ නොවන්නේ නම් පාර්ලිමේන්තුව විසිරවීමට ඔවුන් එකඟ නොවන්නේ නම් විධායක බලතල වර්තමාන දුෂ්ට පාලනයට පැවරීම වැරදි නිසා මාලිමාව ජනමත විචාරණයේදී ආණ්ඩුව පැරදවීමට කටයුතු කරන්නේය. එයට ජනතා සහාය නැතිකමින් ආණ්ඩුව ජනමත විචාරණයෙන් පරාජය වේ. එහි ප්‍රතිඵලය යළි ජනාධිපතිවරණය පැවැත්වීමට සිදුවීමය. එවිට රනිල් - රාජපක්ෂ කණ්ඩායමට සිදුවන්නේ ජනමත විචාරණයද පරාජය වී

11 වැනි පිටුවට






YES WE CAN

# අර්බුදයක් වූ රනිල්ගේ අයවැය

අපේ රටේ අයවැය ආර්ථික වශයෙන් ඇත්තේද, තිබුණේද අර්බුදයක බව අප කවුරුත් දන්නා කරුණකි. මෙම අයවැය අර්බුදය, "අයවැය පරතරය" හෝ "හිඟය" ලෙස අර්ථකථනය කෙරේ. මෙම "අයවැය හිඟයට" හැමදාම කරගැසුවේ සාමාන්‍ය ජනයාය. සුපුරුදු ලෙසම ඉදිරිපත් වීමට නියමිත අයවැයේද ඇත්තේ හිඟයකි. මෙම හිඟයටද හෙට දිනයේදී කරගැසීමට සිදුවන්නේ සාමාන්‍ය ජනයාටය. මේ නිසා පීඩාවට පත්වන්නේද සාමාන්‍ය ජනතාවය. වැට් බද්ද 18% දක්වා වැඩි කිරීමට යෝජනා වන්නේ ඒ අනුවය. ඒ පිළිබඳව රනිල් රාජපක්ෂලාට කිසිදු අර්බුදයක් නොමැත.

රනිල් රාජපක්ෂලාට ඇති ලොකුම අර්බුදය ආණ්ඩුව පවත්වාගෙන යාමට නොහැකි අර්බුදයයි. අයවැය සම්මත කරගැනීමට නොහැකි වීම යන බිය පදනම් කරගත් අර්බුදයයි. මේ නිසා නව ඇමති ධූර හා තනතුරු පිරිනමමින් ආණ්ඩුව රැකගැනීමේ උත්සාහයක රනිල් රාජපක්ෂ නිරත වී සිටී. මේ අර්බුදයෙන් වාසි ගැනීමට බලා සිටින පොහොට්ටු නියෝජිතයෝ ඊනියා ආණ්ඩු විරෝධයක් රඟදක්වමින් සිටිති. හදිසියේම මතු වූ ආණ්ඩු විරෝධයටත්, ඇමති ධූර පිරිනැමීමටත් හේතුව එයය.


ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය ඇහිරීමට මැතිවරණ කල් දමන විට මෙම ආණ්ඩු විරෝධය පැන නැගුණේ නැත. විදුලි බිල තුන් වතාවක් වැඩි කරන විට අද මතු වී ඇති ඊනියා විරෝධයන් මතු වූයේ නැත. බාල ඖෂධ ගෙන්වා, ඒ මගින් රෝගී ජීවිත නැති වෙද්දී ආණ්ඩුව දෙපිල බෙදුණේ නැත. රටේ සම්පත් අධිරාජ්‍යවාදී වුවමනාවන් අනුව බහුජාතික සමාගම් වෙත පැවරීමට යෝජනා වෙද්දී මෙම පුස් වාග් ගැටුම් දක්නට ලැබුණේ නැත.

හදිසියේම මතුවෙන මෙවැනි ඊනියා කැරලිගැසීම් පිටුපස ඇත්තේ ජනතාව පිළිබඳ ඇති මහා ස්නේහය නොවේ, ජනතාව දිනෙන් දින පීඩාවට පත්කරන ජීවන වියදම පිලිබඳ ඇති වේදනාවද නොවේ, බලයට, තනතුරු හා තානාන්තරවලට ඇති කෑදරකමයි. එම තනතුරු අහිමි වේය යන බියයි. දිනෙන් දින එල්ල වන ජනතා ප්‍රතික්ෂේප කිරීම් ඉදිරියේ දියවී වැටෙන්නට පටන්ගෙන ඇති මේ දූෂිත ධනවාදී කඳවුරේ බලය අහිමි වේයැයි ඇති භීතියයි.

ඒ අනුව යමින් මේ බලලෝභී මහදැනමුත්තා හා ගෝලයින් රොත්ත සිය ආරක්ෂාව පතා, ගසන අලුත්ම තුරුම්පුව නම් අයවැයයි. ෂඑත පදයට නටමින් රටේ ජනතාවගේ අන්තිම රුපියලත් මිරිකා ගන්නා මේ රනිල් රාජපක්ෂලා ඇතුළු හොර නඩය විටින් විට සතුරු මිතුරු වෙස් ගනිමින් පාර්ලිමේන්තුව තුළ සිය බලය රඳවා ගැනීමට තනන ගැටය, ගෙන ඒමට නියමිත අයවැයයි. එනිසා ඒ එකදු ගැටයකට හසු නොවී, ගෙල ළඟින්ම සිරකරනු ලැබ ඇති අපේ ජීවිතය යළි දිනාගැනීම සඳහා සියලු පිටපත් අවබෝධයෙන් යුතුව කියවා ගැනීම වැදගත්ය.

## සබඳ

පෙළමින් සා කුස
යෙහෙන් මහවුන් වැජඹෙත්
දුටින් ඒ බව සහසැස්ව
ගිය මග
සාධාරණත්වයේ ලොවකට
ගෙනයනු වස් අප
සබඳ..
නුඹලා හෙළා රුහිරුත්
දරා නෙක නෙක වධයන්
සලා කඳුළුත් දහක් දුක්..
නැගුණත් පෙරඹරින් හිරු
එළිය කරනට නොහැකි
ලොවක්
එළිය කරනට හදවත්
දහක්
මිලිනව ගිය මෙදෙරණත
ඉතිරි කර නමක්
කැටිව වීරත්වය..
ඉල්මහක් ගෙවෙතත් තවත්
සෝ සුසුම් මැද හිත්
අපට ගෙන දුන් වීරයයත්
අද පිණිස හෙට පිණිස
නුඹලා දුන්..
සපථ කරනෙමු හෙටත්
අරගලය දිනන බව
ජයෙන්
සාමයේ ප්‍රේමයේ මග
ඔසවා මහා දිරියෙන්
ඉහළටම නංවා ගොස
එදවස උදා කරනට
සොයුරු පෙම් උපදවා
එක්සිත්...



# හම්බන්තොට අලි රක්ෂිතය තුළ දේශපාලන බලවතුන්ගේ වන විනාශය



SYU හා පරිසර සංවිධාන එකමුතුවේ සාමාජික පිරිසක් හම්බන්තොට අලි කළමනාකරණ රක්ෂිතය තුළ සිදුවන පරිසර විනාශය පිළිබඳ සොයා බැලීමට පසුගිය ඔක්තෝබර් 30 දින විමර්ශන චාරිකාවක නිරත වූහ.

රජයේ ප්‍රබල ඇමතිවරුන්ට අයත් අදටත් සක්‍රීය ලෙස ගල් කඩන ගල් කොරිද, අලි මංකඩවල් අවහිර වනසේ දැවැන්ත අලි වැටවල් ඉදි කරමින් සිදු කරන ජාවරම්කාරයින්ගේ දැවැන්ත වාණිජ භෝග වගාවන්ද එහිදී නිරීක්ෂණයට ලක්විය.

හම්බන්තොට වරාය, මත්තල ගුවන්තොටුපල, අධිවේගී මාර්ග, සම්මන්ත්‍රණ ශාලා ආදී සංවර්ධන කටයුතු වෙනුවෙන් විශාල වශයෙන් වනාන්තර, පරිවාරක වනාන්තර, ප්‍රේරණ කලාපවල ඉඩම් ලබා ගැනීමත් සමඟ 2008ට පෙර නොවූ විරූ ලෙස අලි මිනිස් ගැටුම වර්ධනය විය. එය තව තවත් තීව්‍ර වන්නේ මැති ඇමතිවරුන් සහ ඔවුන්ගේ ගජ මිතුරන් ගල් කැඩීම, පස් කැපීම සඳහාත් ආර්ථික බෝග වගා කිරීම සඳහාත් විශාල වශයෙන් ඉඩම් අත්පත් කරගැනීමත් සමඟය. ඔවුන් දැවැන්ත අලි වැටවල් ඉදිකරමින් ඔවුන්ගේ වගා බිම් ආරක්ෂා කරගැනීමට කටයුතු කිරීමේදී තම නිජ භූමිය අහිමි වූ අලි ඇතුන් ගම් වැදීම අනිවාර්ය ප්‍රතිඵලයකි.

ගොවි ජනතාවගේ වගා බිම් විනාශ වෙමින් අලි මිනිස් ගැටුම වර්ධනය වෙද්දී ඊට විසඳුමක් ලෙස ගොවි සංවිධාන, පරිසර සංවිධාන, හම්බන්තොට ජනතාව ඉල්ලුවේ අලි කළමනාකරණ රක්ෂිතයක් වෙන් කර දෙන ලෙසය.

2011 දී යෝජනා වූ මෙම අලි කළමනාකරණ රක්ෂිතයට ඇමතිවරුන් සහ ගජ මිතුරන් අත්පත් කරගත් ඉඩම් ඇතුළත් වූ නිසා පාලකයන් දිගින් දිගටම එය මඟහරින ලදී. එහෙත් 2021 ජනවාරි මස ගොවි ජනතාව එය දිනා ගැනීම වෙනුවෙ දැවැන්ත අරගලයක් ආරම්භ කළ අතර 2021 අප්‍රේල්වලදී හම්බන්තොට අලි කළමනාකරණ රක්ෂිතය ගැසට් කිරීමට පාලකයන්ට සිදු විය.

එයින් වසර දෙකක් ගත වී ඇතත් අලි කළමනාකරණ රක්ෂිතයේ තිබූ ගල් වලවල්, අනවසර වගාවන් ඉවත් කර අලින්ට විසීමට හැකිවන ලෙස සකස් කිරීමට පාලකයන් කිසිදු පියවරක් ගෙන නොමැති අතර තව තවත් ඉඩම් අත්පත් කරගනිමින් මහා පරිමාණ වගාවන් සිදු කිරීම, දැවැන්ත ගල් මෝල් පවත්වාගෙන යමින් පරිසරය විනාශ කිරීම, සූර්ය විදුලි බලාගාර ඉදි කිරීම සිදු කෙරෙමින් පවතී.

මේ නිසා පෙරටත් වඩා ඛේදජනක ලෙස හම්බන්තොට ජනතාව අලි මිනිස් ගැටුමට මුහුණ දෙමින් සිටින අතර ඔවුන්ගේ ඉල්ලීම වන්නේ ගැසට් කරන ලද අලි කළමනාකරණ රක්ෂිතය තුළ ජාවාරම්කාර පරිසර ඝාතකයින් සිදු කරන විනාශය නතර කර අලි ඇතුන්ට බාධාවක් නොවන ලෙස රක්ෂිතය ආරක්ෂා කර දෙන ලෙසය. ඒ සම්බන්ධව ක්‍රියාමාර්ග නොගතහොත් පරිසර සංවිධාන හා ජනතාව එක්ව මෙම සටහන ජයග්‍රහණය තෙක් ගෙන යන බව ඔවුන්ගේ අදහස විය.

# සමාජ මාධ්‍ය මර්දන පනත හකුළා ගනු!




සංශෝධන එපා! සමාජ මාධ්‍ය මර්දන පනත වහා හකුළා ගනු! මැයෙන් විරෝධතාවයක් සමාජවාදී තරුණ සංගමය මගින් ගම්පහ දුම්රියපළ ඉදිරිපිටදී පසුගිය ඔක්තෝබර් 29 දින පැවැත්විය. ආණ්ඩුව විසින් මේ වන විට ගෙනවිත් ඇති මාර්ගගත ආරක්ෂණ පනක (Online Safety Bill) හෙවත් සමාජ මාධ්‍ය මර්දන පනත විසින් අදහස් ප්‍රකාශ කිරීමේ අයිතියට විශාල බාදාවක් වන අතර ආණ්ඩුවට විරුද්ධ මත ඉදිරිපත් කරන්නම් දඩයම් කිරීමට මෙමගින් හැකියාව ඇත. එම නිසා බොහෝ පිරිසකගේ විරෝධයක් මතු වී ඇති අතර මේ සඳහා ශ්‍රේෂ්ඨාධිකරණයේ පෙත්සම් 31ක් ගොනු කර ඇත. එම නිසා ආණ්ඩුව විසින් මෙම පනතට බොරු සංශෝධන ඉදිරිපත් කර නැවත වටයකින් ගෙන ඒමට ආණ්ඩුව සූදානමින් සිටී. එම නිසා ඊට එරෙහිවත් මෙම පනත හකුළා ගන්නා ලෙසත් බලකරමින් මෙම උද්ඝෝෂණය පැවැත්විණි.

# නිරායුද ඊශ්‍රායල් හා පලස්තීන ජනතාව ඝාතනය කිරීම හෙළා දකිමු!



මේ වන විට ආරම්භ වී ඇති පලස්තීන - ඊශ්‍රායලය ගැටුම නිසා නිරායුද සිවිල් වැසියන් විශාල ප්‍රමාණයක් ඝාතනය වෙමින් තිබේ. එම නිසා නිරායුද ඊශ්‍රයල් හා පලස්තීන ජනතාව ඝාතනයට එරෙහිවත්, නිදහස් පලස්තීනයක් හා ඊශ්‍රයලයක් වෙනුවෙන් UN යෝජනාව වූ ද්වි-රාජ්‍ය විසඳුම බලාත්මක කරන ලෙස උද්ඝෝෂණයක් හා පාගමනක් පසුගිය ඔක්තෝබර් 18 දින පැවැත් විණි. ශ්‍රී ලංකා පලස්තීන කාර්යාලය අසලින් ඇරඹි මෙම පාගමන එක්සත් ජාතීන්ගේ නියෝජිත කාර්යාලය දක්වා යෑමට සංවිධානය කෙරිණි. කෙසේ වෙතත් ආරම්භයේ සිටම පොලිස් බාධා කිරීම් සිදු වූ අතර අවසානයේ පිරිස එක්සත් ජාතීන්ගේ නියෝජිත කාර්යාලය අසලට ගොස් විරෝධතාවයද සිදු කළේය. මේ සඳහා Friends of Palatine, Sri Lanka Journalists for Global Justice සහ සමාජවාදී තරුණ සංගමය එක්ව සිටියේය.




## ඝනත්වයෙන් වැඩි අඟහරුගේ ද්‍රව යකඩ



නව අධ්‍යයනයකින් අඟහරු ග්‍රහයාගේ ද්‍රව යකඩ හරය කලින් සිතුවාට වඩා කුඩා සහ ඝනත්වයෙන් වැඩි බව සොයාගෙන ඇත.

InSight මෙහෙයුම මගින් වාර්තා කරන ලද අඟහරු භූ කම්පන දත්ත විශ්ලේෂණයෙන් හෙළි වී ඇත්තේ අඟහරුගේ ද්‍රව යකඩ හරය කිලෝමීටර 150ක ඝනකමකින් යුතු උණු කළ සිලිකේට් තට්ටුවකින් වට වී ඇති අතර එහි ප්‍රතිඵලයක් ලෙස එහි හරය කලින් යෝජනා කළ ප්‍රමාණයට වඩා කුඩා හා ඝනත්වයෙන් වැඩි බවයි.

වසර හතරක් පුරා නාසා ඉන්සයිට් ලෑන්ඩරය එහි භූ කම්පන මානය සමඟ අඟහරු මත කම්පන වාර්තා කළේය. පෘථිවියට සම්ප්‍රේෂණය කරන ලද ග්‍රහලෝකයේ අභ්‍යන්තර ව්‍යුහය තීරණය කිරීමට අදාළ දත්ත එකතු කර විශ්ලේෂණය කිරීමෙන් ETH Zurichහි පර්යේෂකයන් විසින් එම තොරතුරු අනාවරණය කර ගනු ලැබ ඇත.

## එක්සත් ජනපදයේ ඉහළම භෞතික විද්‍යා ත්‍යාගය චීන විද්‍යාඥයෙකුට



විද්‍යාඥ Xue Qikun, වසර 70ක සම්මාන ප්‍රදාන ඉතිහාසයේ පළමු වරට එක්සත් ජනපදයේ වඩාත්ම ගෞරවණීය භෞතික විද්‍යා සම්මානය ලැබූ පළමු චීන විද්‍යාඥයා බවට පත්ව සිටියි.

ඇමරිකානු භෞතික සංගමයේ 2024 Oliver E' Buckley Condensed Matter Physics ත්‍යාගය Xue සහ Harvard University හි Ashvin Vishwanath ඒකාබද්ධව ප්‍රදානය කරන ලදී.

Xue ඔහුගේ විශ්වවිද්‍යාල කණ්ඩායම සමඟ එක්ව ඊළඟ පරම්පරාවේ, අඩු ශක්ති පරිභෝජන ඉලෙක්ට්‍රොනික උපකරණ සංවර්ධනය කිරීම සඳහා, මෑතකදී සොයාගත් ක්වොන්ටම් පදාර්ථ තත්වයක පවතින ද්‍රව්‍ය පංතියක් වන ස්ථාන විද්‍යාත්මක පරිවාරක සංස්ලේෂණය කිරීමට කටයුතු කර තිබිණි.

## කංසා නොවන ශාක වර්ගයකින් කංසා සංයෝගයක් සොයා ගනී



විද්‍යාඥයින් විසින් සාමාන්‍ය බ්‍රසීලියානු ශාකයකින් කංසාවල අඩංගු සංයෝගයක් වන cannabidiol(CBD) සොයා ගෙන ඇත.

දකුණු අමෙරිකානු රටේ බොහෝ ප්‍රදේශවල වර්ධනය වන සහ බොහෝ විට වල් පැලෑටියක් ලෙස සලකනු ලබන පඳුරක් වන Trema micrantha blume ලෙස හැඳින්වෙන ශාකයක CBD සොයා ගත් බව Rio de Janeiro ෆෙඩරල් විශ්වවිද්‍යාලයේ අණුක ජීව විද්‍යාඥ Rodrigo Moura Neto මාධ්‍ය වෙත පවසා තිබේ.

අපස්මාරය, නිදන්ගත වේදනාව සහ කාංසාව ඇතුළු තත්වයන්ට ප්‍රතිකාර කිරීම සඳහා ඇතැමුන් වැඩි වැඩියෙන් භාවිතා කරන CBD, කංසාවල ඇති ප්‍රධාන ක්‍රියාකාරී සංයෝගවලින් එකකි.

# වෙන් වෙන් සටන් නොව රටම නිදහස් කර ගැනීමේ එකම සටනක් අප හමුවේ තිබෙනවා

**නියමුවා:- දශක දෙකකට වැඩි කාලයක සිට ජලය විකිණීමේ උත්සාහයක් තිබුණත් මේ දක්වා එය පරාජය කළ හැකි වුණා. රනිල් රාජපක්ෂ ආණ්ඩුව නැවත එම ක්‍රියාවලියට පණදීම ඔබ විග්‍රහ කරන්නේ කොහොමද?**

**සමන්ත විද්‍යාරත්න සහෝදරයා:-** ලෝකයේ තිබෙන ස්වභාවික සම්පත් අතරින් වටිනාම සම්පත ජලය. අධිරාජ්‍යවාදීන්ගේ මට්ටමින් ජලය විකුණා ලාභ ලැබීම දශක ගණනාවක පෙර සිට සැලසුම් කර තිබුණා. ලංකාවේ 1980 දශකයේ සිට මේ රටේ පාලකයන් සමග එකතු වුණු පාලකයන් ජල සම්පත විකුණන්න අවශ්‍ය පිඹුරුපත් සකස් කළා. ඒ වෙනුවෙන් ගෙන ආ අනපනත් සෑම එකක්ම පරාජය කරන්න මේ රටේ ජනතාවට හැකිවුණා. ඒ සඳහා විශේෂ නායකත්වයක් දේශපාලන ව්‍යාපාරයක් හැටියට ජනතා විමුක්ති පෙරමුණෙන් ලබාදුන්නා. වර්තමානයේදී අලුත් වටයකින් පනත් පනවමින් ජලය විකිණීමේ ක්‍රියාවලිය ඉදිරියට ගෙනත් තිබෙනවා. ගෝඨාභය ජනාධිපති වී මහින්ද අගමැති වී සිටි වෙලාවේ වක්කඩෙන් අත සෝදාගෙන දේශපාලනයට පැමිණි බව කියන පවුල් පාලනය යටතේ මහින්ද රාජපක්ෂ අගමැති යටතේත් ලංකාවේ ජලය පෞද්ගලීකරණය කරන්න මූලික සොයා බැලීම් සඳහා වාර්තා කැඳවීමක් කළා. නැවත වටයකින් පටන්ගත් එම ක්‍රියාවලිය රනිල් වික්‍රමසිංහ පොහොට්ටුවෙන් පත්කර ගත් ජනාධිපති යටතේ වේගවත් කර තිබෙනවා.

අගමැති දිනේෂ් ගුණවර්ධන කැබිනට් මණ්ඩලයට ජල සම්පත් ප්‍රතිපත්තියක් ගෙනත් පසුගිය ජූලි මාසයේදී අනුමත කර ගත්තා. ඒ අනුව ජල කළමනාකරණ නව පනතක් හැටියට ගෙන ඒමට දස දෙනෙකුගෙන් යුත් කමිටුවකුත් මේ වන විට පත්කර තිබෙනවා. මාසික දීමනා, යානවාහන කාර්යාල පහසුකම් යනාදී සියල්ල මහජන මුදලින් ලබාදෙමින් මහාචාර්ය සී.එම්. මද්දුම බණ්ඩාර යටතේ මේ කමිටුව ක්‍රියාත්මක වෙනවා. ජලය පෞද්ගලීකරණය කිරීමට අදාළ නව අනපනත් සූදානම් වෙමින් තිබෙන්නේ මේ යටතේයි.

**නියමුවා:- මහජන විරෝධය නොතකා, ආණ්ඩුව අත්තනෝමතික ලෙස රටේ සම්පත් විකිණීමේ ක්‍රියාවලියක් වේගෙයන් සිදු කරගෙන යනවා. ඒ තුළ ජල සම්පත රැකගැනීම බරපතළ අභියෝගයක් නේද?**

**සමන්ත විද්‍යාරත්න සහෝදරයා:-** ඔබ කීවා සේම රටේ එක සම්පතක් නොවෙයි විකුණන්නේ. සියල්ලම විකිණීමේ තත්වයක් තිබෙන්නේ. ඉතිහාසයේ නම්, ජලය විකිණීමේ පනත වෙනම අරගෙන පරාජය කළ හැකිව තිබුණා. ඒ වෙනුවෙන් රටම එකතු කර ගත හැකිව තිබුණා. එදා එය පරාජය කිරීම ලෙහෙසි වුණා. නමුත් අද ආණ්ඩුව සමස්තය විකුණන තැනට ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ කොන්දේසි ඉටුකරමින් ගෙනත් තිබෙනවා. ඒ නිසා ජලය විකිණීම පරාජය කිරීමට වෙනම සටනකුත් අනෙකුත් ඒ ඒ සම්පත් විකිණීම පරාජය කරන්න වෙන වෙනම සටන් ක්‍රියාත්මක කරනවාට වඩා කළ යුතුව තිබෙන්නේ මුළු රටම නිදහස් කර ගැනීමේ එකම සටනක්.

ජල සම්පත කියන්නේ මිනිසුන්ගේ විතරක් නොවෙයි, සත්ව ශාක සියල්ලේම මූලිකම අවශ්‍යතාවයක්. ස්වභාව ධර්මයා දුන් ජල සම්පත අද වෙනකොට මානව අයිතියකුත් වෙලා තිබෙනවා. විශේෂයෙන්ම අපේ රට වගේ රටක ජලය මත පදනම් වූ ආර්ථිකයක්, ජලය මත පදනම් වූ සංස්කෘතියක් තිබෙනවා. කෘෂිකර්මය මත පදනම් වූ වාරි ශිෂ්ටාචාරයක් අපට තිබෙනවා. මේ නිසා අනෙක් රටවලට වඩා අපේ රටේ ජල සම්පත විශේෂයි. ජලය හා නොබැඳුණු මිනිසෙක් නැහැ. මේ නිසා ජල සම්පත රැකගැනීමේ සටන සියලු මිනිසුන් ඒකරාශී කරගත් එකම පෙරමුණකට ගෙන ආ හැකියි.

**නියමුවා:- ගෝල්ෆේස් අරගලය කියලා, පොදුවේ හඳුන්වන මහජන නැගිටීමෙන් පස්සේ යම් උදාසීනත්වයක් ජනතාව තුළ පේන්න තිබෙනවා. මේ තුළ ජලය සම්පත රැකගැනීමේ අරගලයකදී ඔබ හිතන ආකාරයේ මහජන මැදිහත් වීමක් ප්‍රායෝගිකව ලබාගත හැකිද?**

**සමන්ත විද්‍යාරත්න සහෝදරයා:-** සටන්වල පසුබෑම් සහ අවදිවීම් වගේම ජයග්‍රහණත් තිබෙනවා. ලෝක ඉතිහාසයේම එහෙමයි. ගෝල්ෆේස් අරගලයට ලක්ෂ සංඛ්‍යාත ජනතාවක් එකතු වුණා. ඒ අය රටේ සැබෑ වෙනසක්, සිස්ටම් එකේ වෙනසක් බලාපොරොත්තු වුණත් ඒ අරගලය අවසන් වන විට අපේක්ෂා කළ ජයග්‍රහණය දක්වා තාමත් ගෙනියන්න අසමත් වී තිබෙනවා. මේ නිසා මිනිසුන් තුළ යම් පසුබෑමක්, කනස්සල්ලක් තිබෙන බව ඇත්ත.

නමුත් අපේ අරමුණ තිබෙන්නේ පවතින ක්‍රමය වෙනස් කරන්න නම්, පවතින අඩුපාඩුකම් සකස් කරගෙන නිවැරදි අරගලයකට යා යුතුව තිබෙනවා. නිවැරදි නායකත්වයක්, නිවැරදි වැඩපිළිවෙළක්, සහ නිවැරදි සැලැස්මක් සමග අපි ඉදිරියට යමින් සිටිනවා. අපේ දේශපාලන ඉතිහාසය ගත්තත් සටන් පරාදවීම් වගේම ජයග්‍රහණත් ලබා තිබෙනවා. අර්බුද සහ අභියෝගවලට මුහුණ දී තිබෙනවා. ඒ සමග සලකා බලන විට ගෝල්ෆේස් අරගලයෙන් පසුව ජනතාවගේ උදාසීනත්වය අල්ප වශයෙන් බලපාන්නක් කියලයි හිතන්නේ. තවත් පැත්තකින් ගත්තහම පොදු ජනතාව අරගලය නවත්වලා නැහැ. වෙනදාට වඩා පීඩාවට පත්වී සිටින ජනතාවට සැබෑ වෙනසක් ලබා ගැනීමේ අවශ්‍යතාවක් තිබෙනවා. ඒ නිසා අපි සමස්තයක් ලෙස මේ ක්‍රමය පරාජය කිරීම සඳහාත් විශේෂයෙන්ම ජල සම්පත විකිණීම පරාජය කිරීම සඳහාත් විශේෂ වැඩපිළිවෙළක් සකස් කර තිබෙනවා. ඒ නිසා අපි වැඩිකල් නොගොස් දුෂ්ට පාලකයන් පළවා හැරීමේ ක්‍රියාමාර්ගයට රට මෙහෙය වනවා. ඒ වෙනුවෙන් පක්ෂයක් හැටියට අපි සූදානම් වෙමින් කටයුතු කරමින් සිටිනවා.



**ජාතික ජන බලවේගයේ ජාතික විධායක සභික**
**සමන්ත විද්‍යාරත්න සහෝදරයා**

> **මහ බැංකුවට වඩා වටිනා අපේ ජල බැංකුවට සුද්දය දෙන්නයි මේ සූදානම් වෙන්නේ. මහ බැංකුවට සුද්දය දීපු මිනිහා ජල බැංකුවටත් අත තියන්නයි හදන්නේ. අපි ඒකට කිසිසේත්ම ඉඩ දෙන්නේ නැහැ. කෘෂිකර්මාන්තයට යොදා ගන්නා ජලයට මිලක් අය කරන්නේ කොහොමද?**

**නියමුවා:- අපේ රටේ ජල සම්පත විකිණීමේ ක්‍රියාවලිය හා සමගාමීව විදුලිබල උත්පාදනයට යොදා ගන්නා ජලාශ විකිණීමේ ක්‍රියාවලියක් ඇරඹී තිබෙනවා. මේ තත්වය ඔබ දකින්නේ කොහොමද?**

**සමන්ත විද්‍යාරත්න සහෝදරයා:-** ජල විදුලිය විතරක් නොවෙයි. භූගත ජලය, මතුපිට ජලය, යන දෙආකාරයේම ජල සම්පත වාණිජ වටිනාකමක් සහිත මිල කරන භාණ්ඩයක් ලෙස විකුණා දැමීමට විවිධ ක්‍රියාමාර්ග ගෙනත් තිබෙනවා. ලෝක බැංකුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වැනි අධිරාජ්‍යවාදීන් මැදිහත් වන සංවිධාන ජල සම්පත පෞද්ගලීකරණය කිරීමට ලෝකය පුරාම විවිධ ක්‍රියාමාර්ග ගත්තා. ඒ වෙනුවෙන් ලෝක මට්ටමින් ජල කළමනාකරණ මධ්‍යස්ථාන පිහිටුවීමට ඔවුන් උත්සාහ කළා. නමුත් ලෝකයේ ප්‍රගතිශීලී මිනිසුන් මේ අනතුර දැකලා අනෙකුත් රටවල ජාත්‍යන්තර ජල කළමනාකරණ මධ්‍යස්ථානයක් පිහිටුවීමට ඉඩක් ලබාදුන්නේ නැහැ. අප්‍රිකාවේ, දකුණු අමෙරිකාවේ හෝ ආසියාවේ කිසිම රටකින් මේ මධ්‍යස්ථානයට ඉඩමක්වත් දුන්නේ නැහැ. නමුත් චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග ජනාධිපති අවධියේ ලෝක මට්ටමින් ජලය විකුණන්න ක්‍රියාකරන ආයතනයකට ලංකාවෙන් ඉඩමක් දුන්නා. 'ඉමි' කියන ආයතනය බත්තරමුල්ලේ පිහිටුවනු ලැබූයේ මේ නිසයි. ඔවුන් ලෝකයේම ජල කළමනාකරණය කියන විකිණීමේ ක්‍රියාවලිය වෙනුවෙන් අපේ රටේ ඉඳන් කුරුමානම් අල්ලමින් ඉන්නවා. ඔවුන් කරන්නේ රටවල් ගොඩගැනීම නොව, රටවල් දඩයම් කිරීමයි. වැව්, ගංගා, ඇළ දොළ, උල්පත් පමණක් නොවෙයි, භූගත ජලය පවා විකිණීමට සැලසුම් කර තිබෙනවා. ඒ අනුව ජලය මිලදී ගන්න බහුජාතික සමාගම් කිහිපයක්ම ලංකාවට ආවා. සාකච්ඡා පැවැත්වූවා. නමුත් පොදු ජනයාගේ උද්ඝෝෂණ හමුවේ ඒ සියලු ප්‍රයත්නයන් පරාජය කළ හැකි වුණා.

නමුත් මේ අවස්ථාවේ විශේෂ අවධානය යොමු කළ යුතු පැත්තක් තිබෙනවා. අපේ රට කෘෂිකාර්මික රටක් නිසා විශේෂයෙන්ම වාරි ජලය අවශ්‍ය වෙනවා. එදිනෙදා ගෘහ අවශ්‍යතාවය සඳහාත් ජලය අවශ්‍ය වෙනවා. වාණිජ කටයුතු සඳහාත් අවශ්‍ය වෙනවා. මේ වගේ විවිධ ප්‍රධාන අවශ්‍යතාවයන් ජලය සම්බන්ධයෙන් තිබෙනවා. දැන් ඉදිරිපත් කර තිබෙන කැබිනට් සංදේශයේ පවා අපේ රටේ කෘෂිකර්මාන්තයට යොදා ගන්නා ජලය ප්‍රමාණය මුළු අවශ්‍යතාවලින් 88%ක් බව සඳහන් කර තිබෙනවා. 88%ක් වූ ප්‍රධාන ජල පංගුව ගොවීන් මේ දක්වා පරිහරණය කරන්නේ මුදල් ගෙවා ලබාගැනීමෙන් නොවෙයි. සොබාදහමෙන් ලැබෙන වැස්ස අනුව වැව් අමුණු ඉදිකර ගොවියාට ජලය ලබාදීම මේ දක්වා සිදුකර තිබෙන්නේ මිලක් අයකිරීමෙන් තොරවයි. අපි විදුලිය බිල ගෙවන විට විදුලි උත්පාදනයට ගන්නා ජලය වෙනුවෙන් අය වෙන මිලක් ඇතුළත් වෙනවා. ගෘහස්ත ජලය ලබාගැනීමේදීත් එහෙමයි. නමුත් මහ බැංකුවට වඩා වටිනා අපේ ජල බැංකුවට සුද්දය දෙන්නයි මේ සූදානම් වෙන්නේ. මහ බැංකුවට සුද්දය දීපු මිනිහා ජල බැංකුවටත් අත තියන්නයි හදන්නේ. අපි ඒකට කිසිසේත්ම ඉඩ දෙන්නේ නැහැ. ජල විදුලියට, ගෘහස්ථ ජලයට වගේම කාර්මික කටයුතුවලට යොදා ගන්නා ජලයට මිලක් අය කරනවා වගේ කෘෂිකර්මාන්තයට යොදා ගන්නා ජලයට මිලක් අය කරන්නේ කොහොමද? ඔවුන් ඒ සඳහා කිසියම් සැලසුමක් ඉදිරිපත් කරාවි. නමුත් ඔවුන්ගේ සියලු සැලසුම් පරාජය කරන්න අපට හැකියාව තිබෙනවා.

**නියමුවා:- මේ වන විට රටේ ස්වාභාවික ඛනිජ සම්පතත් රාජ්‍ය ඉඩම් ටිකත් විකුණන්න කටයුතු කරමින් තිබෙනවා නේද? මේ සියලු තත්වයන් පරාජය කළ හැක්කේ කෙසේද?**

**සමන්ත විද්‍යාරත්න සහෝදරයා:-** මීට දශක ගණනාවකට උඩදී මේ පාලකයන් විකුණන්න පටන් ගත්තේ කර්මාන්ත විකිණීමෙන්. දැන් සොබාදහම කැබලි කර විකුණන්න තිබෙන සමස්ත සැලැස්ම තුළ තමයි ඉඩම්, ජලය සහ ඛනිජ සම්පත් විකුණන්නේ. ශ්‍රී ලංකාව කියන්නේ ඇගේම පාලකයන් යටතේ මේ දක්වා සකල විධ අනතුරුවලට මුහුණ දුන් රටක්. මේ ඉන්නේ පාලකයෝ නොවෙයි, දඩයක්කරුවෝ. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ප්‍රමුඛ අධිරාජ්‍යවාදීන්ගේ වුවමනාවන් සම්පූර්ණ කරන පාලකයන් ගෙන යන ක්‍රියාමාර්ගවලින් රට මුදා ගෙන මෙය අභයභූමියක් කළ යුතුයි. අපේ සමස්ත ක්‍රියාකාරිත්වය තිබෙන්නේ ශ්‍රී ලංකාව මිනිසාට පමණක් නොවෙයි, සතා සීපාවා, ගහකොළ ඇතුළු සියල්ලන්ටම අභයභූමියක් කිරීමේ ක්‍රියාමාර්ගවලටයි.

ගොවි ජනතාව, විදුලිය පරිහරණය කරන ජනතාව, ගෘහස්ථ ජල පරිභෝගිකයන්, කර්මාන්තකරුවන් ඇතුළු සියලු දෙනා වෙත බලපාන මෙම ප්‍රශ්නය ඒ ඒ ක්ෂේත්‍රවල වෙන් වෙන් සටන් ලෙස නොව එකම පොදු සටනකින් ජයග්‍රහණය කරන්න අපි සියලු සැලසුම් සකස් කරමින් සිටිනවා. ඒ වෙනුවෙන් ගෙනයන අරගලය තව ඉතාමත්ම කෙටි කාලයකදී අපි ජයග්‍රහණය කරන බවට අපට විශ්වාසයක් තිබෙනවා.

# ඊශ්‍රායලයේ ගාසා ප්‍රහාර මැදපෙරදිග බල තුලනය බිඳදමයිද?




පසුගිය ඔක්තෝබර් 7 වනදා පලස්තීනයේ හමාස් සංවිධානය ඊශ්‍රායල ජාතිකයන් පදිංචි ප්‍රදේශවලට ඇතුළු වී එල්ල කළ ප්‍රහාරයෙන් පසුව ඊට ප්‍රතිප්‍රහාර වශයෙන් ඊශ්‍රායලය, පලස්තීනයේ ගාසා තීරයට ප්‍රහාර එල්ල කරන්නට පටන් ගත්තේය. එය මෙම ලිපිය ලියන මොහොත වනවිටත් නොනැවතී සිදුවෙමින් ඇති අතර වහාම 'මානුෂික සටන් විරාමයකට' යන ලෙසට ඊශ්‍රායලයට බල කරමින් ලොව පුරා විරෝධතා පැන නැගෙන්නට පටන් ගෙන තිබේ.

ඊශ්‍රායලය පවසන ආකාරයට හමාස්වරුන් ඔක්තෝබර් හත් වන දින එල්ල කළ ප්‍රහාරයෙන් ඊශ්‍රායල් ජාතිකයන් 1300කට වැඩි පිරිසක් මියගොස් 3200කට ආසන්න පිරිසක් තුවාල ලබා තිබේ. නොවැම්බර් 01 දින වන විට, එනම්, දින විසිහතරක් ගත වෙද්දි ඊශ්‍රායලය පලස්තීන ගාසා තීරයට එල්ල කළ ප්‍රහාරවලින් 8500කට වැඩි පිරිසක් ඝාතනය වී ඇති බවත් ඒ අතරින් වැඩි ප්‍රමාණයක් ළමුන් හා කාන්තාවන් බවත් බවත් පලස්තීන සෞඛ්‍ය අමාත්‍යාංශය ප්‍රකාශ කර තිබේ. මෙම ප්‍රහාරවලින් ගාසාතීරයේ 14,000කට වැඩි පිරිසක් තුවාල ලබා ඇති අතර ප්‍රහාරයට ලක් වූවන්ගෙන් 70%ක් පමණ ළමුන්, කාන්තාවන් හා වයස්ගත පුද්ගලයන් බව පලස්තීනය ප්‍රකාශ කර සිටී. ඔක්තෝබර් අවසන් වන විටත් ඊශ්‍රායලය ගාසා තීරය තුළ ගොඩබිම් මෙහෙයුම් ආරම්භ කර නොතිබූ නමුත් කවර හෝ මොහොතක එය අරඹීමේ සූදානමින් උතුරු ඝාසා ප්‍රදේශයෙන් ජනතාවට ඉවත්වන ලෙසට දැනුම් දී තිබුණි.

ඔක්තෝබර් හත් වන දින සිදු වූ ප්‍රහාරයන්ට වගකිව යුත්තේ පලස්තීන හමාස් සංවිධානය වුවත් ඊශ්‍රායල ප්‍රතිප්‍රහාර එල්ල වී ඇත්තේ ගාසා තීරයේ පොදු ජනතාව වෙතය. එය කිසිවකුට අනුමත කළ හැකි ප්‍රතිචාරයක් නොවේ. මේ තත්වය තුළ වහාම මානුෂික සටන් විරාමයක් ඇති කරලීම සඳහා ඊශ්‍රායලයට බල කිරීමට එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලය තුළ යෝජනා සම්මත කරගැනීමට සිව් වරක් උත්සාහ කළද ඒ සියල්ල අසාර්ථක විය. ඒ සෑම අවස්ථාවකදීම එක්සත් ජනපදය නිෂේධ බලය යොදාගනිමින් යෝජනාව සම්මත වීම වළක්වාලනු ලැබීය. මේ අතර එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය හමුවේ 'මානුෂික සටන් විරාමයක්' සඳහා ඊශ්‍රාලයට බල කරමින් ගෙන ආ යෝජනාවට පක්ෂව ඡන්ද 121ක් ලැබුණු අතර ඊට එරෙහිව ලැබුණේ ඡන්ද දාහතරක් පමණි. රටවල් 44ක් ඡන්දය දීමෙන් වැළකී සිටියේය. එහෙත් එය හුදු මතයකින් ඔබ්බට නොයන්නේ ආරක්ෂක මණ්ඩලය තුළ සම්මත වන යෝජනාවක් මෙන් ඊට නීතිමය තත්වයක් නොමැති බැවිනි.

ඊශ්‍රායල පලස්තීන ප්‍රශ්නයට එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් සම්මත කරගත් නිශ්චිත විසඳුමක් ඇත. එනම් පලස්තීනය හා ඊශ්‍රායලය ලෙස ස්වාධීන රාජ්‍යයන් දෙකක පැවැත්මයි. එකී රාජ්‍යයන් දෙකෙහි දේශසීමාවන් 1967 වසරේ දී ඇති වූ සය දින යුද්ධයට පෙර තිබූ දේශ සීමා බවට පත්විය යුතුය යන්නයි. එහෙත් පසුගිය ඉතිහාසය පුරාම ඊශ්‍රායලය එකී විසඳුම නො පිළිගනිමින් පලස්තීනයේ ප්‍රදේශ අත්පත් කරගනිමින් ජනාවාසකරණයේ යෙදුණි. ඊශ්‍රායලයට ඒ සඳහා ආධාර අනුබල දෙනු ලැබුවේ ඇමරිකා එක්සත් ජනපදයයි.

මෙවර ඇතිවූ අර්බුදයේ දී ද ඇමරිකා එක්සත් ජනපදය වහාම ඊශ්‍රායලයේ පාර්ශ්වය ගනිමින් එක්සත් ජනපද යුධ නැව් එකී ප්‍රදේශයේ ස්ථානගත කළ අතර වෙනත් ආකාරයන් ගෙන්ද සහාය ලබාදීමට කටයුතු කරන ලදී.

ඔක්තෝබර් අවසන් වන විට ගාසා තීරයේ මියගිය ළමුන් ගණන 3450කි. මේ තත්වය තුළ විශේෂ ප්‍රකාශයක් කළ යුනිසෙෆ් සංවිධානය 'ගාසා තීරය ළමුන් දහස් ගණනකගේ සොහොන් පිටියක්' බවට පත් වී ඇති බවටත් වහාම මානුෂික සටන් විරාමයක් ප්‍රකාශයට පත් කළ යුතු බවටත් ප්‍රකාශයක් නිකුත් කළේය. එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කාර්යාලයේ අධ්‍යක්ෂ ක්‍රෙග් මොබිබර් මෙම ජන සංහාරයට විරෝධය පළ කරමින් හා සිය ඉල්ලා අස්වීමට හේතු දක්වන පිටු හතරක ලිපියක් යවමින් සිය ධුරයෙන් ඉල්ලා අස් වී තිබේ. එහිදී ඔහු චෝදනා කර තිබෙන්නේ එක්සත් ජාතීන්ගේ සංවිධානය ඇමෙරිකා එක්සත් ජනපදයේ බලයට යට වී ඊශ්‍රායලයට වාසිදායක ලෙස කටයුතු කරන බවටයි.

මේ අතර ඊශ්‍රායලය ගාසා තීරය තුළ ගොඩබිම් මෙහෙයුම් ආරම්භ කිරීමත් සමග ඇතැම් රටවල් හා පලස්තීන හිතවාදී සන්නද්ධ කණ්ඩායම්ද ගැටුමට මැදිහත් වීමේ අවදානම මතුවී තිබේ. හිස්බුල්ලා සංවිධානය, යේමන් ආණ්ඩුව, ඉරානය ආදී රටවල්ද එසේ වුවහොත් තමන්ද ඊට මැදිහත් වන බවට දැනටමත් අනතුරු අඟවා තිබේ. බොලිවියාව විසින් වහාම ඊශ්‍රායලය සමග රාජ්‍යතාන්ත්‍රික සබඳතා අත්හැර දමනු ලැබීය.

එක්සත් ජනපදය ප්‍රමුඛ අධිරාජ්‍යවාදී රටවල පාලකයන් මෙම අර්බුදයේදී ඊශ්‍රාලයට සහාය දැක්වුවද එකී රටවල ජනතාව ඊශ්‍රායලයේ මෙම ජන සංහාරයට එරෙහිව වීදි බැස විරෝධය පළ කරන්නට පටන්ගෙන තිබේ. පසුගිය ඔක්තෝබර් 28 වන දින ලන්ඩන් නුවරට රැස් වූ 50,000ක පමණ ජනතාවක් විරෝධතාවයේ යෙදුණේ වහාම සටන් විරාමයකට යාමට බල කරමිනි. මීට අමතරව මැන්චෙස්ටර් ග්ලාස්ගොව් ඇතුළු නගර ගණනාවකදීද ජනතාව වීදි බැස විරෝධතාවෙහි යෙදුනහ. මීට අමතරව යුරෝපා රටවල ජනතාවද ඔස්ට්‍රේලියාව, එක්සත් ජනපදය, අප්‍රිකානු රටවල ජනතාවද මේ ආකාරයෙන්ම විරෝධතා ක්‍රියාමාර්ගවල යෙදී සිටී.

වර්ධනය වෙමින් පවතින තත්වය ජාත්‍යන්තර දේශපාලනය තුළ මින් පෙර නොවූ ආකාරයේ කැළඹීමක් ඇති කර තිබේ. මේ තවදුරටත් මේ ආකාරයෙන්ම වර්ධනය වුවහොත් එය ලෝක දේශපාලන බල තුලනයේද වෙනස්කම් ඇති කරනු ඇතැයි දේශපාලන විචාරකයෝ මත පළ කරති.

## මාලදිවයින: නව ජනාධිපතිවරයෙකුගේ පාලනයට



පසුගිය ඔක්තෝබර් මාසයේ දී පැවැති මාලදිවයින් ජනාධිපතිවරණයෙන් ප්‍රගතිශීලී සන්ධානය නියෝජනය කරමින් තරග වැදුණු මොහොමඩ් මුයිසු 54%ක ඡන්ද ප්‍රතිශතයක් ලබා ගනිමින් ජයග්‍රහණය කර තිබේ. ඔහු එළඹෙන නොවැම්බර් 17 වන දින මාලදිවයිනේ ජනාධිපතිවරයා ලෙස දිවුරුම් දීමට නියමිතය. ජයග්‍රහණයෙන් පසු ඔහු බීබීසී ප්‍රවෘත්ති සේවය හමුවේ ප්‍රකාශ කර තිබුණේ ඔහුගේ පාලන කාලය තුළ මාලදිවයින් භූමියෙහි විදේශ හමුදා රැඳී සිටීමට ඉඩ නොතබන බවය. දැනට ඉන්දියාව විසින් ලබාදෙන ලද ගුවන් යාන ඇතුළු උපකාර නඩත්තුව සඳහා ඉන්දියන් හමුදා සාමාජිකයන් 75 දෙනෙකු පමණ මාලයෙහි රැඳී සිටින බවට ගණන් බලා තිබේ.

## යුරෝපා සංගමය: ආර්ථික අර්බුදයේ ප්‍රතිඵල දකිමින්




2023 වසරේ දෙවන කාර්තුව වන විට, වසර අටක් තුළ, යුරෝපා සංගමයෙහි බංකොලොත් වූ වැඩිම සමාගම් ගණන වාර්තා වී තිබේ. අප්‍රේල් හා ජූනි අතර ව්‍යාපාරවලින් ඉවත් වූ සමාගම් ගණන පෙර කාර්තුවට වඩා 8.4%කින් ඉහළ ගොස් තිබේ. ආහාර සේවා සමාගම්වලින් 23.9%ක් ප්‍රවාහන හා ගබඩා සමාගම්වලින් 15.2%ක් අධ්‍යාපන, සෞඛ්‍ය හා සමාජ ක්‍රියාකාරී ක්ෂේත්‍රයෙහි සමාගම්වලින් 10.1%ක් මෙලෙස බංකොලොත් වී තිබේ.

## එක්සත් ජනපදය: වැඩවැරූ කම්කරුවන් ජය ලබා




එක්සත් ජනපදයේ විශාලතම මෝටර් රථ නිෂ්පාදන සමාගම් තුනෙහි සේවකයින් ආරම්භ කළ වැඩවර්ජනය ඔක්තෝබර් 31 දින ජයග්‍රහණයෙන් අවසන් විය. ස්ටෙලැන්ටිස්, ෆෝඩ් සහ ජෙනරල් මෝටර්ස් සමාගම්හි සේවකයන් මෙම වැඩවර්ජනය ආරම්භ කරන ලද්දේ පසුගිය සැප්තැම්බර් 15වැනි දාය. එකඟ වූ නව වැටුප් වැඩි වීම අනුව කම්කරු වැටුප පැයකට ඩොලර් 40ට වඩා වැඩි වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

## ඕස්ට්‍රේලියාව: ස්වදේශික ජනතාවගේ පිළිගැනීම නොපිළිගෙන




ඕස්ට්‍රේලියානු ව්‍යවස්ථාව තුළ එරට ස්වදේශික ජනතාවට පිළිගැනීමක් ලබා දීම සඳහා වූ ජනමත විචාරණයෙන් එකී යෝජනාව ප්‍රතික්ෂේප වී තිබේ. එහිදී යෝජනා කර තිබුණේ එරට ස්වදේශීය ජනතාව වෙනුවෙන් පාර්ලිමේන්තුව තුළ 'ස්වදේශික උපදේශක සභාවක්' ගොඩනැගීමටයි. මෙම යෝජනාවට එරෙහිව 60%ක ඡන්ද ප්‍රමාණයක් ලැබී තිබුණු අතර ඊට පක්ෂව ලැබී තිබුණේ සියයට හතළිහකට ආසන්න ඡන්ද ප්‍රමාණයක් පමණි.

# IMF දෙවැනි මුරය සහ විදුලි සැර වැද්දවීම!

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම යටතේ සැප්තැම්බර් මාසයේදී අනුමත කළ යුතු දෙවැනි ණය වාරිකය ලබා දීම පසුගියදා අනුමත කළ බව මාධ්‍ය මගින් වාර්තා විය. ඒ සමගම යළිත් වටයකින් විදුලි බිල ඉහළ දැමීමත්, විදුලිබල මණ්ඩලය ප්‍රතිව්‍යුහගතකරණය කිරීමේ යෝජනා පිළිබඳවත් සාකච්ඡාවක් ආරම්භ වී තිබේ.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ලංකාව ගිලී ඇති ණය අර්බුදයෙන් හුස්ම හිර නොවී මිය නොයා තබා ගැනීමට යෝජනා කර ඇති ඩොලර් බිලියන 2.9ක ණය පහසුකම් පැකේජයේ පළමු කොටසේ සාකච්ඡාව අවසන් වූයේ සේවක අර්ථසාධක අරමුදලේ ප්‍රතිලාභීන් මෙතෙක් ලබා ගනිමින් තිබූ ප්‍රතිලාභ කප්පාදුවට ලක්වීමෙනි.


දැන් දෙවනි වාරිකයේ සාකච්ඡාව හමාර වෙමින් තිබෙන්නේ කරුණු 16ක් අඩංගු ලියවිල්ලක් අනුව විදුලි බිල ඉහළ දැමීමෙන් ජනතාව කබලෙන් ලිපට ඇද දමන ක්‍රියාමාර්ගයත් සමගය!

## IMF යෝජනා 16

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල තමන්ගේ දෙවැනි ණය වාරිකය නිදහස් කරන්නේ නම්, ඉටු කළ යුතු ප්‍රමුඛ නිර්දේශ 16ක් කාලරාමු සහිතව ආණ්ඩුවට ඉදිරිපත් කරන ලදී. ඒ බොහෝ කරුණු ආණ්ඩුවට වියදමක් නොදරාම පාර්ලිමේන්තුවේ නීති පනත් සංශෝධන මගින් ඉටු කළ හැකි කරුණුය. 2024 ජූලි මාසය වනවිට පාර්ලිමේන්තුවේ සම්මත කරනු ලබන දූෂණ විරෝධී නීතියට අනුව නම් කරන වෙබ් අඩවියක ජනාධිපති, අගමැති සහ ඇමැතිවරුන්ගේ වත්කම් බැරකම් ප්‍රකාශ ප්‍රසිද්ධ කිරීම. දූෂණයට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතීන්ට ගැලපෙන පරිදි අපරාධ නීති සම්පාදනය කිරීම, ජාත්‍යන්තර යහපාලන ප්‍රතිපත්ති පිළිබිඹු වන පරිදි රාජ්‍ය ප්‍රසම්පාදන නීතියක් පැනවීම, ආණ්ඩුවේ තරගකාරී ටෙන්ඩර් ප්‍රසම්පාදන කොන්ත්‍රාත්තුවල ප්‍රගතිය පිළිබඳව වාර්තාවක් නම් කරන වෙබ් අඩවියක ප්‍රකාශයට පත් කිරීම, මාර්ගගත ඩිජිටල් ඉඩම් ලේඛනයක් ස්ථාපිත කර සියලුම රජයේ ඉඩම් ලියාපදිංචි කිරීම, අධිකරණ සේවා කොමිෂමට ඇති සම්පත් හා සේවා පුළුල් කිරීම මගින් අධිකරණ ක්ෂේත්‍රයේ පාලන විධි විධාන වෙනස් කිරීම වැනි යෝජනා ඒ අතර වේ. මෙම යෝජනා ණයක් නොදී වුව අපි රටක් ලෙස ක්‍රියාත්මක කරගත යුතු අපගේ ගැටලුය. මූල්‍ය අරමුදල නොකීවත් ක්‍රියාත්මක කරගැනීම අපට වාසිදායකය.

නමුත් මෙම යෝජනා 16න් 13 වන යෝජනාව විශේෂය. එහි දක්වා ඇත්තේ 'පුළුල් උපදේශන ක්‍රියාවලියක් අනුගමනය කරමින් 2024 ජූනි මස වනවිට CBSL (මහබැංකුව) කළමනාකරණ විධිවිධාන ස්ථාපිත කිරීම සඳහා විකල්ප පිළිබඳ කැබිනට් ප්‍රතිපත්ති පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම' යනුවෙනි.

මේ අර්ථසාධක අරමුදල අලෙවි කිරීමට අදාළ යෝජනාවයි. එසේම ජීවන බර ඉහළ යන පරිදි නැවත වතාවක් විදුලි බිල ඉහළ දමා ඇත්තේද රාජ්‍ය ව්‍යාපාර පිළිබඳව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ප්‍රතිපත්තිවලට අදාළ වන පරිදිය. රාජ්‍ය ව්‍යාපාර වෙළඳපොළ තරගයකට ඇතුල් කර ආණ්ඩුව නිදහස් විය යුතුය යන ප්‍රතිපත්තිය අනුව දැන් වරින් වර මහජන සේවා සපයන ආයතනවල සේවා (ඉන්ධන, ජලය, විදුලිය වැනි) මිල තීරණය කිරීම ආරම්භ කරනු ලැබ ඇත.




## විදුලි සැරේ බර!

ආණ්ඩුව ඉතාම මෑතකදී විදුලි බිල වැඩිකර ඇත්තේ හදිසියේ විදුලි බල මණ්ඩලය පාඩු ලබන නිසාවත්, ජල විදුලිය සැපයීමට නොහැකි නියඟය වැනි තත්වයක් නිසාවත් නොවේ. මිල සූත්‍රයක් ක්‍රියාත්මක වුවද එහි කොන්දේසිද කඩකරමින් ආණ්ඩුව විදුලි බිල ඉහළ දමා ඇත්තේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ කොන්දේසි සැපිරීමටය. ආණ්ඩුව පිරිවැයට මිල ගැලපිය යුතුය යන මූල්‍ය අරමුදලේ නිර්දේශය මෙමගින් ක්‍රියාවට නැඟීම අපූරුවට සිදුකර ඇත. 2018දී විදුලි ඒකක 90ක් පරිභෝජනය කළ පාරිභෝගිකයා ගෙවන ලද්දේ රු. 990කි. අද ඒ ඒකක 90 වෙනුවෙන් ඔහු රු. 4140ක් ගෙවිය යුත්තේය. එම බර දැරීම විදුලියට පමණක් නොවේ. 2018 දී පෙට්‍රල් ලීටරයක් රු. 117කි. දැන් ඒ ප්‍රමාණය 2023දී රු. 365කි. අවුරුදු 05ක් තුළ මිල වැඩිවීම 212%කි. ඒ කාලයේම රු. 1431ට තිබූ ගෑස් සිලින්ඩරය දැන් රු. 3470කි. අඩු තරමේ පාන් ගෙඩියකවත් මිල අඩුවී ජනතාවට සහනයක් ලැබී නැත. මීට වසර 05කට කලින් රු. 60ට තිබූ පාන් ගෙඩියක් අද රු. 140කි. ජනතාව අද පාරට බැස ඇත්තේ විදුලි බිල වැඩි කිරීමට එරෙහිව පමණක් නොවේ. මේ සියලු ජීවන වියදම් බරට එරෙහිවය. අනෙක් අතට ආණ්ඩුව තමන්ගේ අමාරුකම් ජනතාව කරමතට පතිත කරන්නේ ජනතාව සියලු සැප පහසුකම් යටතේ කිසිදු බරක් පීඩනයක් නැතිව ජීවත් වෙන පිරිසක් යැයි සිතාගෙන විය යුතුය.

> ජනතාව අද පාරට බැස ඇත්තේ විදුලි බිල වැඩි කිරීමට එරෙහිව පමණක් නොවේ. මේ සියලු ජීවන වියදම් බරට එරෙහිවය. අනෙක් අතට ආණ්ඩුව තමන්ගේ අමාරුකම් ජනතාව කරමතට පතිත කරන්නේ ජනතාව සියලු සැප පහසුකම් යටතේ කිසිදු බරක් පීඩනයක් නැතිව ජීවත් වෙන පිරිසක් යැයි සිතාගෙන විය යුතුය.

## විසඳුම වැඩි කිරීමද?

ආණ්ඩුවේ උපක්‍රමය වී ඇත්තේ වැඩිවන වියදම, හොරකම් කිරීමේ පිරිවැය, නාස්තියේ ගාස්තුව සියල්ල මහජනයා වෙත සෘජුව පැටවීමයි. ඒ වෙනුවට වෘත්තිමය දෘෂ්ටිකෝණයකින් ප්‍රශ්නයට අවතීර්ණ වී වියදම අඩුකර ජනතාවට සහනයක් දීමට ආණ්ඩුව ලෑස්ති නැත. විදුලි බිලම සලකා බැලුවද? එක විදුලි ඒකකයක් නිපදවීමේ වැඩිම වියදම දරනු ලබන්නේ ජනන වියදම ලෙසිනි. එය මුළු වියදමින් 77%කි. සම්ප්‍රේෂණ හා බෙදාහැරීම (TVD) වියදම 14%කි. ආයතනික මූල්‍ය වියදම 09%කි. 2023.10.18 විදුලි බල මණ්ඩලය ඉදිරිපත් කළ දත්ත අනුව වත්මන් විදුලි ඒකකයක සමාන්‍ය පිරිවැය රු. 31කි.

දැනට අන්තර්ජාතික මිල කැඳවීම අනුව ඉදිකරන මෙ.වො. 300ක LNG තාප බලාගාරය දැනට ඉදිවෙමින් පවතී. තවත් බලාගාර 03ක් ඉදිකිරීමට අපේක්ෂා කළද අඩුතරමේ ටෙන්ඩර් මගින් මිල ගණන් කැඳවීමක් වත් මේ දක්වා සිදු කර නොමැත. අද ඉදිකිරීමට මිල ගණන් කැඳවුවද වැඩ නිමකර ජනතාවට විදුලිය දීමට තවත් අවු. 04ක්වත් ගතවනු ඇත. එහෙත් අධික මිල ගණන් යටතේ ඩීසල් ඉන්ධන මිලදී ගෙන ඩීසල් බලාගාරවලින් විදුලිය සපයා ගත යුතුය. ලෝක වෙළඳපොලේ ඉන්ධන මිල ඉහළ යාමට ඇති ප්‍රවණතාවය අනුව විදුලි ඒකක ජනන වියදම වැඩිවනු මිස අඩු නොවනු ඇත. මේ එක් උදාහරණයක් පමණි. මීට අමතරව පුනර්ජනනීය බලශක්තිය ලෙස සූර්ය බලය ආදියද විදුලි බල මණ්ඩලය මිලදී ගන්නේ ඉහළ මිල ගණන්වලටය. ඒ සියල්ලම සාමාන්‍ය ජනතාව යළි විදුලි බිලෙන් ආණ්ඩුවට ගෙවිය යුතුය.

වසර 05ක් තුළ භාණ්ඩ හා සේවා මිල ඉහළ යාම

| භාණ්ඩය | 2018 | 2023 | වසර 5ක් තුළ මිල වැඩිවීමේ % |
|---|---|---|---|
| රතු කැකුළු කි.1 | 83.00 | 175.00 | 111% |
| පරිප්පු කි.1 | 148.00 | 330.00 | 123% |
| සීනි කි.1 | 107.00 | 280.00 | 162% |
| පාන්පිටි කි.1 | 92.00 | 220.00 | 139% |
| පිටිකිරි 400 ට | 326.00 | 1080.00 | 231% |
| පොල් ගෙඩි 1 | 65.00 | 110.00 | 69% |
| බිත්තර 1 | 16.00 | 45.00 | 181% |
| කුකුල්මස් කි1 | 540.00 | 1250.00 | 131% |
| පාන් ගෙඩි 1 | 60.00 | 140.00 | 133% |
| පෙට්‍රල් ලීටර් 1 | 117.00 | 365.00 | 212% |
| ගෑස් 12.5 නට | 1431.00 | 3470.00 | 143% |
| විදුලි ඒකක 90ක් සඳහා | 990.00 | 4140.00 | 318% |

## විදුලි බදු

ඉන්ධන මිගින් විදුලිය නිපදවීමේදී ලබාදෙන ඉන්ධන සඳහා විදුලි බල මණ්ඩලය ඛනිජ තෙල් සංස්ථාවට ගෙවීම් කරන්නේ සාමාන්‍ය වෙළඳපොළේ ඉන්ධන විකුණන මිලටමය. එවිට ඉන්ධන ලෙස අයකරන බදු මෙන්ම විදුලි බිල ලෙස අයකරන බදුද ජනතාව විසින් ගෙවිය යුතුය. ඉන්ධනවලින් ලබා ගන්නා විදුලිය සඳහා සෑම තෙල් ලීටරයකටම 23%ක බද්දක් විදුලි පාරිභෝගිකයින් විසින් රජයට ගෙවනු ලබයි. එසේම සමාජ ආරක්ෂණ බදු ලෙස තෙල්වලින් 1.25%ක්ද විදුලි බිල මගින් 2.5% (බිලේ අවසාන අගයට අයකරන සමාජ ආරක්ෂණ බදු) පාරිභෝගිකයා විසින් ගෙවිය යුතුය. ඒ එකම බද්ද දෙවරක් ගෙවීමකි. මීට අමතර ගල් අඟුරු භාවිතා කරන විට 15%ක වැට් බදුද ආණ්ඩුව අය කරයි. මේ සියලු බදු විදුලිය පරිභෝජනය කරන ජනතාව විසින් ගෙවිය යුතුය. මේ බදු බර අඩු කළ විට විදුලි බල මණ්ඩලයටද ලාභදායී ලෙස ආණ්ඩුවට බරක් නොවී පාරිභෝගිකයාටද දැරිය හැකි මිලකට විදුලිය අඛණ්ඩව සැපයිය හැකිය. ඒ සඳහා ආණ්ඩුවේ බදු විදුලි බිලට එක් නොකළ යුතුය.

## අයවැය අභිමුඛ ජනබලය

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ යෝජනා අනුව ආණ්ඩුව වියදම් අඩු කර ආදායම වැඩි කර ගත යුතුය. ඉදිරි නොවැම්බර් 13 ඉදිරිපත් කරන අයවැය බොහෝ විට මැතිවරණ ඉලක්ක කළ සැරසිල්ලක් විය හැකිය. ඒ සඳහා අඩුකරන සොච්චම අයවැයට කලින් මිස අයවැයෙන් පසුව ආදායම ලෙස එකතු කර ගැනීම ආණ්ඩුවට ඉතා අසීරුය. ඒ නිසා ඉදිරි අයවැයෙන්ද සහන අපේක්ෂා කිරීම ප්‍රතිඵල විරහිත විය හැක. ඒ වෙනුවට පලස්තීන - ඊශ්‍රායල් යුද්ධයද එකතු කර ඉන්ධනවල මිල ඉහළ දැමිය හැකිය. ජනතාව එක්කෝ මේ ආණ්ඩුව මිල වැඩි කරන වාරයක් වාරයක් පාසා ගෙවීමට හිත හදා ගත යුතුය. නැතිනම් ගෙවීම සහ පන්දම් අල්ලාගෙන කෑගැසීම නතර කිරීමට හිත හදාගත යුතුය. මිල වැඩි කරන සතියේ උද්ඝෝෂණය කර ඊළඟ සතියේ එය ගෙවීමට වැඩියෙන් වැඩ කිරීම දැන් නතර කළ යුතු කාලය එළඹ ඇත. ඒ කළ හැක්කේ සිදුවීම් සමස්තයටම එරෙහිව සිදුකරන මහජන අරගලයක ප්‍රතිඵල වලින් පමණි.



"සෑම විප්ලවයකින්ම අති විශාල ජන සංඛ්‍යාවක ජීවිත තුළ තියුණු වෙනස්කම් ඇති කෙරෙන්නේය. එවැනි වෙනසක් ඇති වීමට කල් යල් මෝරා තිබේ නම් මිස, නියම විප්ලවයක් සිදු විය නොහැකිය. එසේම, පුද්ගලයෙකුගේ ජීවිතයේ සිදුවන ඕනෑම වෙනසක් ඔහුට බොහෝ දේ උගන්වන, සාරවත් අත්දැකීම් ලබා දෙන සහ බලවත් චිත්ත වේගාත්මක කුහුල්කම් ගෙන එන ලෙසටම, විප්ලවද, කෙටි කාලයක් තුළ මුළු ජනතාවටම සාරවත් හා අගනා පාඩම් උගන්වයි."

**ලෙනින්**
**තෝරාගත් කෘති, 05 වැනි වෙළුම, 189 පිටුව**



# කොන්දේසි නැත, නැවුම් ජන බලවේගයකට පෙළගැසෙමු!

## එක්ව අත් බඳිමු...

උයන් ප්‍රාසාදවල
විතරක් ම නොවුණු
ගල් බොරළු මත පවා
සොඳුරු මල් පිපුණු
අතු පැලක නොවූ
හිත් තිවුණු
මඬුරුවල වුණත් ඇත
ඇවිළෙනා ගැහැනු

වැට තියරු හා සමව
රැඳුණු
දුවිමූ අපි ගොයමකට
එක්ව වින කරනු
පරඬලා කුඹට
එය ඉවතලන රිසිනු
ගැහැනුනේ එණිඩ වූ
සුළහක්ව හමනු

කොයි උයනෙ වුණත්
කටු පිරුණු
පර නොවී යළි
සුවඳ හමනු

හැකි ලෙසින්
මල් කැකුළු රකිනු
ගැහැනුනේ සිය දහක්
එක්ව අත් බඳිමු

කාන්තාවකට අමානුෂික ලෙස පහර දුන් අඹු සැමි යුවලට ඇප, සැමියා පහර දීමෙන් බිරිඳ මරුට, විදෙස් ගත කරන බව පවසා මුදල් වංචා කළ සැකකාරියක් අත්අඩංගුවට, නිවසේ ඇති වූ ගින්නකින් කාන්තාවක් ජීවිතක්ෂයට, දරුවා මාර්ගයෙන් මුදල් සහ ජංගම දුරකථන හොරකම් කිරීමේ නිරතවූ මවක් අත්අඩංගුවට, දඹුල්ල රෝහලේ විදුලි සෝපානය තුළදී කාන්තාවකට හදි කරලා, විවාහ වී මාසයයි බිරිඳ මැරූ සැමියා අත්අඩංගුවට, සැප්තැම්බරයේ දැරියන් 168 ක් අපයෝජනය වේ. මේ කාන්තාවන් සම්බන්ධයෙන් පළවූ ප්‍රවෘත්තිවල සිරස්තල ලයිස්තුව තවත් දිගුව ලිවිය හැකිය. නමුත් සරල නිගමනයට එසේ කිරීම අවැසි නැත. සැබෑ තත්වය ප්‍රවෘත්තිවලින් ඔබ්බට ගොස් ඇති බව පැහැදිලිය.

එහෙත් මෙවැනි සිදුවීම් එකිනෙකා විග්‍රහ කර ගන්නේ තම නැණ පරාසය අනුවය. කෙනෙකුට මෙය ආගමෙන් දහමෙන් ඈත් වීම සම්බන්ධ ප්‍රශ්නයකි. තවකෙකුට නීතියේ ආධිපත්‍ය බිඳ වැටීම, පුරුෂාධිපත්‍ය. අනාරක්ෂිතභාවය, සංස්කෘතියේ බිඳ වැටීම, සාරධර්ම පිරිහීම, ලිංගික අධ්‍යාපනය නොමැතිකම වැනි දේය. අන්ධයාට අලියා විටෙක කුල්ලක් වැනිය, විටෙක වංගෙඩියකි, තවත් විටෙක සර්පයෙකි. නමුත් අලියා යනු අලියා මිස වෙනකෙක් නොවේ. අප ජීවත්වන සමාජයේ බහුතරයක් බොහෝ සිදුවීම් තේරුම් ගන්නේ මෙසේය. එසේ නම් කාන්තාවන්, දැරියන් හිංසනයට ලක්වීමේ සැබෑ හේතුව කුමක්ද?

අද වන විට පාලකයන් විසින් රට උග්‍ර ආර්ථික අර්බුදයකට පත් කර අවසන් බව අප සැවොම දන්නා කරුණකි. ඒ යථාර්ථය තුළතීව්‍ර මන්දපෝෂණයෙන් පෙළෙන දරුවන් 15,763ක් මේ වසරේ හඳුනාගෙන ඇත. ගර්භණී මව්වරුන්ගේ මන්දපෝෂණයද පෙර වසරට සාපේක්ෂව වැඩිවී ඇත. තවද පවුල්වලින් 33% ක් තම දෛනික ආහාර වේල් ගණනද, පවුල් 47%ක් තමන් ගන්නා ආහාර ප්‍රමාණයද අඩු කර ඇත. පවුල් 27%ක වැඩිහිටියන් තම දරුවන්ට ආහාර ලබාදීම වෙනුවෙන් ඔවුන්ගේ ආහාර වේල කැපකර ඇති බව වාර්තා පෙන්වා දෙයි.

ලාංකීය සමාජයේ ආකල්ප අනුව පවුලේ ප්‍රධානියා පුරුෂයාය. ඒ අනුව බොහෝ පවුල් වල තීරණ ගැනීමේ බලය හිමි වී ඇත්තේ පුරුෂයාටය. ඒ තත්වය තුළ නිවසේ අගහිඟ කම්, අඩු පාඩු දරා ගැනීම මෙන්ම දුවා දරුවන්ගේ සේම ගෘහයේ අනෙක් කටයුතුද පැවරී ඇත්තේ ගැහැනියටයි. ඒ හා සමානව එම කටයුතුවලදී සිදුවන අතපසුවීම්වලටද වන්දි ගෙවීමට සිදුවී ඇත්තේද ඇයටයි. පුරුෂයාගේ දෝෂාරෝපණයට මෙන්ම පහරදීම්වලටද ලක් වීමටද ඇයට සිදුවේ. ඒ අනුව දැඩි ආර්ථික අවපාතයකට රට ලක්ව ඇති මේ මොහොතේ පුරුෂයා මත එල්ලවන ආර්ථික හා සමාජීය පීඩනය දෝර ගලා යන්නේ ගැහැනිය මතිනි. පවුල තුළ ආර්ථිකය පසුබෑමට ලක් වන සෑම මොහොතකම ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය හිස ඔසවයි. එහි ප්‍රධාන ඉලක්කය වන්නේ ගැහැනියය.

දැන් අපි සමාජය දෙසට යොමු වෙමු. ගෘහය තුළ ගැහැනිය ලක්වන පීඩනයට වඩා වෙනසක් සමාජයේදීද අපි නොදකිමු. සීඝ්‍රයෙන් බිඳ වැටෙමින් පවතින ආර්ථිකය හමුවේ මතුවන සමාජ අසහනයන්ට බිලි වන ගැහැනුන්ගේ ප්‍රතිශතය ඉහළ යමින් පවතී. අනෙක් අතට දරාගත නොහැකි ජීවන බර හේතුවෙන් විවිධ නීත්‍යානුකූල නොවන මාර්ගයන් මඟින් මුදල් සොයන්නට යෑම තුළ ඔවුන්ගේ ජීවිත අනාරක්ෂිත වී ඇත. වෙළඳපොළ ඉලක්ක කරගත් මාධ්‍ය මගින් උණු කැවුම් ලෙස විකිණෙන්නේ මේවාය.

ඒ කෙසේ නමුත් මෙයින් හිංසනයට ලක්වන්නේත්, මරණයට පත්වන්නේත් අපේ රටේ කුඩා දැරියගේ පටන් වයසක මිත්තණිය දක්වා වූ ගැහැනුන්ය; ලංකාවේ ජනගහනයෙන් 51%ක් පමණ වූ කාන්තාවන්ය; 25%ක් වූ දරුවන්ය.

ආර්ථිකයේ කඩා වැටීම හේතුවෙන් උපදින සොරකම්, වංචා, ස්ත්‍රී දූෂණ සහ මිනී මැරීම් ආදීය නීතිය නිසි ආකාරයෙන් ක්‍රියාත්මක කිරීමෙන් හෝ, ආගම දහමට සමාජය නැඹුරු කිරීමෙන් හෝ
ලිංගික අධ්‍යාපනය ලබාදීමෙන් හෝ පමණක් නවතා ලිය නොහැක. ආර්ථික බිඳවැටීමත් සමග සමාජයේ යහ පැවැත්ම වෙනුවෙන් පවතින්නේයැයි පැවසෙන සියලු සංස්ථාවන්ද බිඳ වැටෙමින් තිබේ.

එනම් මේ සියලු කාරණාවලට හේතු වන ආර්ථිකයේ කඩා වැටීම නවතා එය ගොඩනංවන දිශාවකට රැගෙන යා යුතුය. එසේම ස්ත්‍රී හා පුරුෂභාවය නොසලකා ආර්ථිකයේ ප්‍රතිලාභ සාධාරණ ලෙස බෙදෙන, එසේම දෙපාර්ශවයටම සාධාරණ ලෙස ආර්ථික ක්‍රියාවලියට සම්බන්ධ විය හැකි ආර්ථිකයක් හමුවේ කෙමෙන් සමාජයේ අනෙකුත් ගැටලු මෙන්ම ස්ත්‍රීන් හා ළමුන් වෙත එල්ල වන හිංසනයද අහෝසි වී යනු ඇත.

තවත් යමක් ඉතිරි වන්නේනම් සබුද්ධික සමාජීය තෙරපුම හමුවේ ඒවා වියැකී යනු ඇත. වසර 75ක පමණ කාලයක් මෙරට පාලනය කරමින් ආර්ථිකයත් සමාජ ජීවිතයත් මෙතරම් කඩාවැට්ටවූවන් කිසිදා එවැන්නක් නොකරනු ඇති බැවින් ඔවුන් පලවා හැර ඒ රික්තය පුරවන නැවුම් ජන බලවේගයක් සමග ගැහැනුන් ලෙස අප කොන්දේසි විරහිතව පෙළගැසිය යුතුය.

## “අසාධාරණයට එරෙහි අලුත් ලෝකයක් ගොඩනගමු!”

**නීතිඥ අනුෂ්කා දර්ශනී**
**නුවරඑළිය දිස්ත්‍රික් නියෝජිත**
**අයිතීන් උදෙසා කාන්තාවෝ සංවිධානය**



රට බංකොලොත් වෙලා තිබෙන්නේ ආර්ථික වශයෙන් විතරක් නොවෙයි. මුළු සමාජ සංස්කෘතියම බංකොලොත් වෙලා. කඩාගෙන වැටිලා. අමනුස්සකම හා ම්ලේච්ඡත්වය ඉස්සරහට ඇවිල්ලා. සියලු සමාජ සබඳතා දෙදරා ගිහිල්ලා. අපේ රටේ දරුවන්ගෙන් කොටසක් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි කරලා. තවත් දරුවන් කොටසක් බරපතළ ලෙස ලිංගික අපයෝජනයට පත්වෙලා. ඒ වගේම ගෘහස්ථ හිංසනය සියලු ආයතන තුළ සිදුවෙන කාන්තා හිංසනයත් සියයට දාහකින් වැඩිවෙලා. සියලු දෙනාගේම පීඩනය හා වේදනාව පුපුරා යවන්නෙ දරුවන්ගෙන් හා නිවසේ ගැහැනියගෙන්. ඒ වගේම ලිංගික පිපාසයෙන් හා කඩාවැටෙන හිස් ජීවිත නිරතුරුවම ගැහැනු දරුවන්ගේ හා කාන්තාවන්ගේ ජීවිත බිලි ගන්නා තත්වයකට පත්වෙලා. අපරාධකරුවන් හා අපරාධ, නිදැල්ලේ වැජඹෙන විට නීතියක්, සාධාරණත්වයක් නැති සමාජයක් තුළ පීඩාවට පත්වෙන දරුවන් හා කාන්තාවන් කොතෙක් අරගල හා බලපෑම කළත් අපරාධකාරයෝ නිදැල්ලේ හා නිදහසේ ඒ ඒ දේශපාලනඥයන්ගේ ආරක්ෂාව ඇතිව වැජඹෙනවා. ඒක ඔබේ දරුවාත් ඔබත් ප්‍රකට මුළු සමාජයම අනාරක්ෂිත වෙලා; අපරාධවලින් පිරිලා. නීතියක් සාධාරණයක් තිබෙන මනුස්සකම නැවත ස්ථාපිත කරන, අනෙකාට ආදරය කරන සමාජයක් ගොඩනගන්න පුළුවන් වන්නේ මේ සමාජ ව්‍යසනය හොඳින් තේරුම් ගත් ගැහැනුන්ට ම පමණක්. ඒ සඳහා ඔබ අවදිවන්න. දරුවන්ගේ අනාගතය අපරාධකරුවන්ට අසාධාරණයට එරෙහිව අලුත් ලෝකයක් ගොඩනගමු.

ලෝක පෙරළින්

## අයිස්ලන්ත කාන්තා සමානාත්මතාවය!



පසුගිය ඔක්තෝම්බර් 24 වන දා අයිස්ලන්ත කාන්තාවන් දසදහස් ගණනක් එක්දින වැඩවර්ජනයක සහ උද්ඝෝෂණයක නිරත වූයේ ස්ත්‍රී - පුරුෂ සමානාත්මතාවය ඉල්ලා සිටිමිනි. මෙය එරට වසර 50 කට පමණ පසු පැවති පළමු එක්දින වැඩවර්ජනය බව කියවේ. සාමාන්‍ය මතය සලකන විට අයිස්ලන්තය ස්ත්‍රී - පුරුෂ සමානාත්මතාවය බොහෝ දුරට පවතින රටක් වශයෙන් සැලකුනද එරට අගමැතිනිය වන කැතරින් ජේකොබ්ඩෝට්ර් ද වැඩවර්ජනයට සහය පළකරමින් ප්‍රකාශ කළේ 2023 වන විටත් පූර්ණ ස්ත්‍රී - පුරුෂ සමානාත්මතාවය පවතින රටක් බවට අයිස්ලන්තයට ළඟා වීමට නොහැකි වී තිබීම දුර්වලතාවයක් ලෙස පිළිගත යුතු බවයි.

## ලතින් ඇමරිකාවේත් උද්ඝෝෂණ!



සැප්තැම්බර් 28 වන දා ලතින් ඇමරිකානු කලාපයේ රටවල ප්‍රධාන නගර පිරී ගියේ දසදහස් ගණන් කාන්තාවන් වීදි බැස ආරක්ෂිත ගබ්සා වෙනුවෙන් වෙන්කර ඇති දිනය සැමරීමට සහ ගබ්සා නීතිගත කිරීමට බලකරමින් පෙළපාළි සහ උද්ඝෝෂණ වල යෙදීම හේතුවෙනි. ගබ්සාව සඳහා අයිතිය ලබාගැනීමට ලතින් ඇමරිකානු කලාපයේ කාන්තාවෝ මේ වන විට දශක ගණනාවක අරගලයක නිරතව සිටිති. එහිම ප්‍රතිඵලයක් වශයෙන් මේ වන විට පූර්ණ ගබ්සා තහනම ඇත්තේ එල් සැල්වදෝරය ඩොමිනිකන් ජනරජය ආදී රටවල් කිහිපයක පමණි. කෙසේ නමුත් ආජන්ටිනාව වැනි රටවල බලයට පත්වීමට නියමිත අති දක්ෂිණාංශක පාලකයින් කලාපීය ජනතාව විසින් දිනාගත් ජයග්‍රහණ ආපස්සට හැරවීමේ අවදානමද පවතී.

## ඉරානයේ මාධ්‍යවේදිනියන් දෙදෙනෙකුට සිර දඬුවම්!



2022 වර්ෂයේ ඉරානයේ සදාචාර පොලිසිය විසින් අත්අඩංගුවට ගෙන සිටියදී මියගිය මාසා අමිනි නම් තරුණියගේ මරණය හේතුවෙන් ආරම්භ වූ ‘ගැහැණිය, ජීවිතය සහ නිදහස’ තේමාව ඔස්සේ වර්ධනය වූ විරෝධතාවලට මේ වන විට වසරකට ආසන්න කාලයක් ගතව ඇත. එකී තරුණියගේ මරණය ආවරණය කිරීම හේතුවෙන් නිලොෆාර් හමේදි සහ එලාහෙ මොහොමදි නම් මාධ්‍යවේදිනියන් දෙදෙනෙකු වසර හතකට සහ හයකට සිර දඬුවමට ලක්කිරීමට එරට අධිකරණය විසින් තීන්දු කර ඇත්තේ ක්‍රම විරෝධයට එරෙහිව සටන් කිරිම සහ තවත් චෝදනා එල්ල කරමිනි. මෙවැනි ක්‍රියාමාර්ග ඉරාන කාන්තාවන් අරගල කිරීම අධෛර්යමත් කිරීමද අරමුණු කරගෙන සිදුකරන බව පෙනේ.

# ඉතිහාසයේ නොමැකෙන ඉල්මහේ මතක



ඉල් මාසය හෙවත් නොවැම්බරය ජ.වි.පෙ.ට අමතක කළ නොහැකි මාසයකි. ජ.වි.පෙ. නිර්මාතෘවරයා වූ රෝහණ විජේවීර සහෝදරයා ඇතුළු නායකයින් හා සාමාජිකයන් විශාල ප්‍රමාණයක් එවකට පැවැති එ.ජා.ප. පාලනය විසින් මරා දමන ලද්දේ ඉල් මාසයේදීය.

ඉල් මාසයේදීත් ඒ ආසන්න වසර කිහිපය තුළත් පාලකයින් විසින් මරාදමන ලද සියලු දෙනා සිහිපත් කරනු ලබන්නේ නොවැම්බරයේදීය.

## අතීතය කරගසා ගෙන යා යුතුද?

මෙහිදී සමාජයේ සමහරුන් නගන පැනයක් වන්නේ 'ජ.වි.පෙ. මෙම ඉතිහාසය තවදුරටත් කරගසාගෙන යා යුතුද' යන්නය. එසේම ඉල්මහ විරුවන් සැමරීම මගින් ජ.වි.පෙ. තවමත් එකී පැරණි දේශපාලන ක්‍රමයන්ගෙන් ගැලවී නැති බව පෙනෙන බවද සමහරු පවසති.

සමාජ සංවර්ධනය පිළිබඳ නිවැරදිව උගැන්වීම වූ මාක්ස්වාදී දර්ශනය පිළිගන්නා පක්ෂයක් වන ජ.වි.පෙ.ට ඉතිහාසය පිළිබඳව ඇත්තේ සාම්ප්‍රදායික කියවීමක් නොවන බව ඉතා පැහැදිලිය. ජ.වි.පෙ. යනු ඉතිහාසය "කරගසාගෙන" යන අතීතය තුළම ජීවත් වන, වෙනස් වීමට සූදානම් නැති පක්ෂයක් නොවන බවත් එය ඉතා නිවැරදිව පවතින තත්වයන් වෙනස් වන විට ඊට අනුව වෙනස්කම් ඇතිකර ගැනීමට සමත් පක්ෂයක් බවත් පසුගිය ඉතිහාසය තුළම ඔප්පු කර තිබේ.

එහෙත් ඉතිහාසය කරගසා ගෙන නොගිය පමණින් ඉතිහාසය අමතක කර දැමීමටද කිසිවකුට නොහැක. මන්ද ඉතිහාසය යනු ඕනෑම දේශපාලන ව්‍යාපාරයකට අත්දැකීම් ලබාදෙන ගුරුවරයෙක් වන බැවිනි. සැබෑ ලෙසම අතීතය තුළ ජීවත් වන්නේ ජ.වි.පෙ නොව ඉතිහාසය වැරදියට අර්ථකථනය කරමින් පැරණි සිදුවීම් මත ජ.වි.පෙට තවමත් අවලාද නගන ධනේශ්වර හා ප්‍රතිවිප්ලවකාරී කණ්ඩායම්ය.

සිය දේශපාලන ව්‍යාපාරය වෙනුවෙන්, ඉන්දීය මැදිහත්වීමට එරෙහිව මාතෘ භූමියේ සැබෑ නිදහස වෙනුවෙන්, තමන්ට දේශපාලනය කිරීමට ඇති ශුද්ධ වූ අයිතිය වෙනුවෙන්, නව සමාජයක් වෙනුවෙන් සටන්කර දිවි පිදූවන් අනුස්මරණය කිරීම ඔවුන්ගෙන් ඉගෙන ගැනීම වමේ දේශපාලන ව්‍යාපාරයකට මඟහැර යා නොහැකි කාර්යකි. ඒ අනුව ජ.වි.පෙ. ඉල්මහ විරුවන් සිහිකරන්නේ අතීතයේ ජීවත්වීමට නොව ජයග්‍රාහී අනාගතයක් වෙනුවෙන් අතීතයෙන් ඉගෙන ගැනීමටය.

## මියගිය අය සමරන්නේ ඇයි?

ඉපදෙන සියල්ලෝම මියැදීම ස්වභාව ධර්මයේ නියත ධර්මතාවයකි. ඉපදී මියැදෙන සියල්ලන්ම ඉතිහාසයක් පුරා කථාබහට ලක්වන්නේ හෝ ඉතිහාසය තුළ නොමැකී පවතින්නේද නැත. එහෙත් ඉතිහාසයේ ගමන්මග වෙනස්කිරීම වෙනුවෙන් මානව වර්ගයාට වඩා හොඳ ජීවිතයක් ලබාදීම වෙනුවෙන් සමාජයේ ප්‍රගතිගාමී මෙහෙවර වෙනුවෙන්, ආත්මාර්ථයෙන් තොරව සටන්කර දිවි පිදූවන් මානව ඉතිහාසය තුළ යළි යළිත් කථාබහට ලක්වීම වැළැක්විය නොහැක.

ජීවිතයට මෙන්ම මරණයටද වටිනාකමක්, අර්ථයක් එකතු කළ මිනිසුන් ඉතිහාසය පුරා අමරණීයව පවතී. සත්‍ය එයයි. ඉතිහාසය පුරා මිනිසුන් විසින් විවිධ අරමුණු වෙනුවෙන් සටන් කර තිබේ. දේපළ ගොඩගැසීම වෙනුවෙන්, රටවල් යටත්කර ගැනීම වෙනුවෙන්, කොල්ලකෑම වෙනුවෙන්, දුබලයින් යටපත්කර පාගා සිටීම වෙනුවෙන්, මිනිසුන් වහලුන් ලෙස තබාගැනීම වෙනුවෙන් සමහරු සටන් කර තිබේ; මියගොස්ද තිබේ. මෙලෙස සටන් කර ඇත්තේ ඒ ඒ යුගයේ පාලක කණ්ඩායම්ය. නැතිනම් දේපළ කොල්ලකනවුන්ය. ඔවුන්ද ඉතිහාසයේ සිටී.

එහෙත් යුක්තිගරුක මිනිසුන් එවැනි අය සමරන්නේ නැත. ලොව ප්‍රගතිශීලී ජනයා ස්පාටකස් ගෞරවයෙන් අනුස්මරණය කළද රෝම පාලකයන් එලෙස සිහිකරන්නේ නැත. ලොව පුරාම චේ ගෙවේරාට ආදරය කරන ජනයා එදා සිටි බොලිවියානු මිනීමරු පාලකයින්ට ආදරය කරන්නේ නැත. කිසිවකු හිට්ලර් සමරන්නේ නැත.

ඉන් කියවෙන්නේ ඉතිහාසය තුළ සැමරීමට ලක්වන්නේ පොදු අරමුණක්, හොඳ අරමුණක්, නිවැරදි අරමුණක් වෙනුවෙන් සටන්කොට දිවි පිදූවන් පමණක් බවය. ඉල් මහා විරුවන් අයත් වන්නේද එම පිරිසටය. ඔවුන් සැමරීම යුක්තිසහගත වන්නේ ඒ නිසාය.

## ඉතිහාසයේ වීරයන් හා ද්‍රෝහීන්

ඉතිහාසය ගොඩනගන්නේ මිනිසුන් බව වරක් මාක්ස් පැවසීය. මිනිසුන් ස්වකීය ඉතිහාසය නිර්මාණය කරන බවත් එහෙත් ඔවුන් එසේ කරන්නේ තමන්ට රිසි පරිදි නොව තමන් වෙත ලැබී ඇති තත්වයක් තුළ හා අතීතයෙන් සංක්‍රමණය වූ තත්වයක් තුළ බවත් මාක්ස් පැවසීය.

ඉතිහාසය ගොඩනගන්නේ මිනිසුන් විසින් වුවද ඉතිහාසය ලියනු ලැබ ඇත්තේ බොහෝ විට මිනිසුන් විසින් නොව බලයේ සිටින පලක කණ්ඩායම් විසිනි. නැතිනම් පාලක කණ්ඩායම් වෙනුවෙනි. විශේෂයෙන්ම සටනකින් පසු හැම විටම ඉතිහාසය ලියනු ලැබුයේ සටනින් ජයගත් අය මිස පරාජයට පත්වූ අය නොවේ. ඒ නිසාම ඉතිහාසයේ ලියවී ඇති සියල්ල සත්‍ය හෝ සාධාරණ වන්නේ නැත.

රෝමයේ වහල් ක්‍රමය තුළ වහල් භාවයේ පීඩාවට එරෙහිව ස්පාටකස් ඇතුළු වහලුන් කැරලි ගැසූ විට එම කැරැල්ල මර්දනය කරන ලදී. එකී සටනින් ජයගත්තේ රෝම පාලකයන්ය. එවිට ඉතිහාසය ලිවුවේ ඔවුන්ය. ඔවුන්ට අනුව ස්පාටකස් ඇතුළු පිරිස 'දාමරිකයින්', 'කැරැලිකරුවන්', 'මිනීමරුවන්', 'කොල්ලකරුවන්' විය. එහෙත් සැබෑ ලෙසම ඉහත සියලු දුර්ගුණයන් සහිත වූයේ රෝම පාලකයන්ය. පසුව රෝම පාලනය බිඳ වැටුන අතර ලොව පුරා පීඩිත ජනතාව, ප්‍රගතිශීලී ජනයා, ස්පාටකස් වීරයෙකු ලෙස සැලකූහ.

ලොව පුරා මෙවැනි අත්දැකීම් බොහෝ සොයාගත හැක. ලංකාවේද 1818 බ්‍රිතාන්‍ය ආක්‍රමණිකයාට එරෙහිව කැරලි ගැසූ කැප්පෙටිපොල ඇතුළු විරුවන් නම් කළේද රාජ ද්‍රෝහීන්, කැරලිකරුවන්, ත්‍රස්තවාදීන් ලෙසය. ඒ, එහි ඉතිහාසය ලියනු ලැබුවේ බ්‍රිතාන්‍යයන් වන නිසාය. 1848දී බ්‍රිතාන්‍ය පාලනයේ පීඩාවන්ට එරෙහිව මාතලේ කැරැල්ල මෙහෙය වූ පුරන්අප්පු ඇතුළු පිරිසද සුදු පාලකයින් විසින් නම් කළේ ත්‍රස්තවාදීන්, රාජද්‍රෝහීන්, මිනීමරුවන් ලෙසය. ඒ, කැරැල්ලෙන් පුරන්අප්පු ඇතුළු පිරිස පරාජය වීමත් ජයග්‍රහණය කළ බ්‍රිතාන්‍යයන් විසින් ඉතිහාසය ලිවීමත් නිසාය.

1989 ඉල් මාසයේදී සිදුවූයේද මෙයමය. රට පාවාදීමට එරෙහිව දියත්වූ දේශප්‍රේමී අරගලය පරාජය විය. පාලකයන් මහා මිනිස් ඝාතනයකින් සටන පරාජය කරන ලදී. වසර කිහිපයක්ම පැවතියේ ජේ.ආර්. පාලනයේ භීෂණයකි. එහෙත් ඉතිහාසය ලියූ පාලකයෝ එම එ.ජා.ප. භීෂණය, ජ.වි.පෙ. භීෂණයක් ලෙස නාමකරණය කළෝය. පාලකයන් විසින් සිදු කළ මහා මිනිස් ඝාතන, පක්ෂ තහනම් කිරීම්, මැර ක්‍රියා සියල්ල සඟවා, සටන් කළ අය ඝාතකයින් ලෙස, ත්‍රස්තවාදීන් ලෙස නම් කරන ලදී. අපේ රටේ සමහරු තවමත් සිටින්නේ ජයවර්ධනලා ලියූ එම ව්‍යාජ ඉතිහාස කථාව තුළය. එම ව්‍යාජ ඉතිහාසය මකාදමා සැබෑ ඉතිහාසය යළි ලිවිය යුතුය. ඉල්මහ විරුවන් සැමරීම ඒ අර්ථයෙන්ද වැදගත්ය.

මර්දනය මගින්, පීඩිතයන් පාගා සිටීම මගින්, මිනිස් ඝාතන මගින්, ජනතාවගේ ලේ කඳුළු මතින් සිය පාලනය පවත්වාගෙන යන පාලක පංතිය කිසි දිනක ඊට එරෙහිව සටන් කරන්නන්ට දිවිපිදූවන්ට වීරත්වය ආරෝපණය කරන්නේ නැත. ඒ වෙනුවට ඔවුන් කරන්නේ පීඩාවට එරෙහිව සටන් කළවුන් ද්‍රෝහීන්, ත්‍රස්තවාදීන්, මිනීමරුවන් ලෙස නම්කර සැබෑ ඝාතකයන් සඟවා ලීමය. එහෙත් ඉතිහාසය කිසියම් දිනක සත්‍ය හෙළිකරන්නේය. එවිට සැබෑ ද්‍රෝහීන් හා ඝාතකයන් කවුද යන්නත් සැබෑ විරුවන් කවුද යන්නත් ජනතාව වටහාගනු ඇත. එතෙක් මේ අවලාද හා වැරදි මත පවතිනු ඇත. එසේ වුවත් ඉතිහාසයේ සත්‍යය මතුකිරීම අපේ වගකීමය. ඉල්මහ විරුවන් ගැන අප කථාකරන්නේ ඒ අරමුණෙනි.

> පාලකයන් විසින් සිදු කළ මහා මිනිස් ඝාතන, පක්ෂ තහනම් කිරීම්, මැර ක්‍රියා සියල්ල සඟවා, සටන් කළ අය ඝාතකයින් ලෙස, ත්‍රස්තවාදීන් ලෙස නම් කරන ලදී. අපේ රටේ සමහරු තවමත් සිටින්නේ ජයවර්ධනලා ලියූ එම ව්‍යාජ ඉතිහාස කථාව තුළය. එම ව්‍යාජ ඉතිහාසය මකාදමා සැබෑ ඉතිහාසය යළි ලිවිය යුතුය. ඉල්මහ විරුවන් සැමරීම ඒ අර්ථයෙන්ද වැදගත්ය.



"සමාජයේ වෙනස්වීම සිදුවන්නේ එහි පවතින ප්‍රතිවිරෝධයන්ගේ වර්ධනය හේතුවෙනි. නිෂ්පාදන බලවේග සහ නිෂ්පාදන සම්බන්ධතා අතර ප්‍රතිවිරෝධයේත්, පංති අතර ප්‍රතිවිරෝධයේත්, අභාවයට යන පරණ දේ හා නැගී එන අලුත් දේ අතර ප්‍රතිවිරෝධයේත් වර්ධනය හේතුවෙනි. පැරණි සමාජය යට කරගෙන අලුත් සමාජයට ඉදිරියට වර්ධනය වීමට ඉඩ දෙන්නේත් මේ ප්‍රතිවිරෝධය නිසාය."

**මාඕ සේතුං**
**තෝරා ගත් කෘති, 01 කාණ්ඩය, 314 පිටුව**

# පොලිටිකල් පංතිය

පොලිටික්කා දවසක් උදේ... උදේ කිවුවට උදේම නෙමෙයි ටිකක් දවල් වෙලා... පංතියට ආවෙ හෙණ ජයග්‍රාහී ලීලාවෙන්. ළමයි ඔක්කොම වගේ උදෙන්ම ඇවිල්ලා වර්ල්ඩ් කප් මැච් සීරිස් එක අප්ඩේට් කරගනිමින් හිටියෙ. පොලිටික්ක කට හද හද හිටපු විදිහට හැමෝම හිතුවෙ පොලිටික්ක කියන්න යන්නේ මැච් සීරිස් එකේ කවුරුත් නොදැන හිටපු අයිටම් එකක් කියලා.

"ගුඩ් මෝනි සර්..." වසන්තිය ඉස්සර වුණා.

"ආයුබෝවන්... ගුඩ්මෝනිං" පොලිටික්ක කිවුවෙ හැරෙන තැපෑලෙන්.

"සර් අද සන්තෝසෙන් වගේ" අනුරුද්දියත් එක දා ගත්ත. "ලංකාව ෆයිනල් එයිද?"

"සතුටු නැද්ද ළමයිනේ... හැබැයි මැච් ගැහිල්ල හින්දා නෙමෙයි. ඔය ළමයි දැක්කද තෙල් අඩු වෙලා. රුපියල් නමයක්..." පොලිටික්කගෙ කට කණේ.

"ඕකට අඩු වෙලා කියන්නෙ කොහොමද සර්. පෙට්‍රල් කීයටද තිබුණේ..." චමිය ගේම ඉල්ලනව.

"හරි දැන් තෙල් අඩු වෙලාම නැද්ද? මිනිස්සුන්ට කීයක් හරි අතේ ඉතුරුයිනෙ" පොලිටික්කත් අරින්නෙ නෑ.

"2021 ජූනි වෙනකොටත් 137යි. 365ට වැඩි කරපු එකෙන් 09ක් අඩු කරනවා. ආණ්ඩුව කාවද මේ රවට්ටන්නෙ" චමිය දත්තත් එක්ක පෙරළා සටනට.

"එහෙම බැලුවොත් අඩු නෑ තමයි... නෑ මං කියන්නෙ... තරගෙ හින්ද මිල අඩු කරන විදිහ" පොලිටික්ක තෙල් ලීටර් බාගයක් බයික් එකට ගහගත්තු වෙලේ ඉඳලා මඟ දිගට හිතපු දේ කියල දාන්නම බලනව.

"තරගෙට අඩු කරන එක කෙසේ වෙතත් තරගෙට මිල වැඩි කරන හැටිනම් ජේනවා" මංජුවත් ඩෑෂ් එකක් අතාරියා.

"දැන් අඩු කළේ පෙට්‍රල්වල විතරයිනෙ. ඒකට හරියන්න සමාගම් ඔක්කොම එකට එකතු වෙලා භූමිතෙල්, ඩීසල් වැඩි කළා. සාමාන්‍ය මිනිස්සු යන්නෙ බස්වල. බස්වලට ගහන්නේ ඩීසල්. ඩීසල් වැඩි වුණාම බස් ගාස්තු වැඩි වෙනවා. ලොරි ගාස්තු වැඩි වෙනවා. ඒ වැඩි වෙන ගාණ බඩුවලට එකතු වෙනවා. ඕක තමයි චක්කරේ" චමියත් නතර වීමක් නෑ.

"දැන් ඔය පෙට්‍රල් පාඩුව අල්ලන්න භූමිතෙල් ඩීසල් වැඩි කළා. සර්ට පෙට්‍රල් ලීටරේකින් රුපියල් 09ක් ඉතිරි වුණා කියලා හිතමුකො. සර් බයික් එකට ගහන්නෙ ලීටර් බාගයයිනෙ. ඉතින් ඉතුරු රුපියල් 4.50යි. අන්න ආණ්ඩුව ඒකටත් වැඩ හැදුවා... සර් අතේ ඉතුරු වෙන සල්ලි ටික එකතු කර ගන්න..." සමන පොලිටික්ක දිහා බලලම කිවුව.

"මොකද්ද සමන් ඒ අපබ්‍රංසෙ" පොලිටික්කට දාඩිය වගේ... බෙල්ලත් පිහදැම්ම.

"අන්න ඒකට කැබිනට් එක එන අවුරුද්දෙ ඉඳලා වැට් බද්ද සියයට 18ක් කළා. දැන් හැම බඩුවක්ම, ගාස්තුවක්ම තවත් සියයට 3කින් වැඩිවෙනවා. හදපු බඩුවක් අපි ගාවට එනකොට වැඩිවීම දෙතුන් පාරක් එකතු වෙන්නත් පුළුවන්. කොහොම වුණත් ඒ සතුට සමරලා ඉවර වෙන්න කලින් ලයිට් බිල වැඩි වෙනවා. මාස තුනෙන් තුනට විදුලි බිල වැඩිවෙන හින්දා ළඟ ළඟ පාටි දාන්නත් පුළුවන්. ඒ අතරට තෙල් මිල වැඩි වෙන එකයි, බස් කෝච්චි ගාස්තු වැඩි වෙන එකයි සමරන්නත් පුළුවන්. සිල්ලර බඩු, එළවළු, මස්, මාළු වගේ ඒවා දිනපතා වැඩි වෙන නිසා සමරගන්න බැරිවේවි. අපි ගන්න එක අතහරින හින්දා වැඩි වෙලාද කියලා දැනගන්නත් කාලයක් යාවි. හැබැයි ටක්කෙටම සිද්ද වෙන වැඩ දෙකක් තියෙනවා. එකක් ආණ්ඩුව කරන්නෙ අපිද කියල හිතෙන තරමට පොහොට්ටුවයි, අලියයි බඩු මිල වැඩිවෙන එකට රණ්ඩු වේවි. බැරිම වුණොත් බඩේ බත් නැති අපිට බලන් ඉන්න ඇමතිකම්වලට හරි රණ්ඩු කරාවි. අනෙක අපිට කෙළ වුණත් ඉක්මණටම උද්ධමනය සෘණ කරලා පෙන්නන්න මහ බැංකුව වගබලා ගනීවි." සමන ආර්ථික පුරෝකථන එකින් එක කියන්න ගත්ත එක සැර වැඩි වුණාද මන්ද පොලිටික්ක මේසෙ වාඩි වෙලා හම් මල්ලට මූණ ඔබා ගත්ත.

කවුළුව හැර තබමි

# ඔවුන් නික්ම ගියේ නැණ පහන් දහසක් දල්වාය...



පෞද්ගලික ජීවන හරය නිරුවත් ලෙස ව්‍යවහාරික මුදලින් ප්‍රකාශ වන වත්මන් ධනපති සමාජයේ ප්‍රධාන හරයන් වනුයේ වංචාව, කැපකිරීම හා අවස්ථාවාදයයි. ඊනියා සුචරිතවාදී සංස්කෘතියකින් ආවරණය වීම හුදු වාණිජ හරයන් පමණක් කාන්දු කොටගත් ධනපති පක්ෂ සහ ඒවායේ ප්‍රමුඛ පෙළේ ක්‍රියාධරයින් මෙතෙක් කටයුතු කරන්නේද හුදු ආත්ම කේන්ද්‍රීය වාණිජ වුවමනාකම් මුදුන් පමුණුවා ගැනීම සඳහාමය.

එහෙත් අපි හැමදාමත් ආදරයෙන් සමරන ඉල්මහ විරුවෝ යනු ඊට හාත්පසින්ම වෙනස් පුළුල් මානවාවාදී භාවිතයකට උරුමකම් කියන සැබෑ මානවාවදී සටන්කරුවෝය.

සැබෑ ලෙසම එවන් මානවවාදී විරුවෙකු විය හැක්කේ ප්‍රථම කොටම කොන්දේසි විරහිතව පවතින ධනේශ්වරයට එරෙහිව යාමෙන් පමණි.

මෙතෙක් ඉතිහාසයේ මානව යහපත තකා තම ජීවිත කැප කළ මිනිසුන් ප්‍රධාන කොටස් දෙකකට බෙදී සිටින බව සරලව බැලූවිට පෙනේ. එක අතකින් අරගලය තුළින් පංති ව්‍යාපාරයට ඇදී ආ අයවන අතර අනෙක් පසින් මානවවාදී වූ හෙයින් සමාජ යහපත වෙනුවෙන් ජීවිතය කැප කළ වුන්ය. සම්ප්‍රදායික අර්ථකථනය අනුව පළමු වර්ගය විප්ලවවාදීන් වන අතර දෙවෙනි වර්ගය සාධු චරිතය. මේ කරුණු දෙක තුළ යාන්ත්‍රිකද නොවී විඥානවාදීද නොවී විප්ලවීය ජීවගුණයෙන් සන්නද්ධ විය හැක්කේ ලෝකය නිවැරදිව කියවා ගත් මිනිසුන්ට පමණි. ඔවුහු ඉහත කී දෙවර්ග යේම මානවවාදී ගුණයන් අත්පත් කරගත් සැබෑ දේශපාලන මිනිස්සු වන්නෝය. සතුරා අපෙන් උදුරාගෙන මරා දැමූ ඉල්මහ විරුවන් යනුද ඊට කිසිසේත්ම අඩු මිනිසුන් නොවේ. ඔවුන් මේ රටේ මිනිසුන්ගේ මොළය ආලෝකමත් කිරීම සඳහා නොකළ පරිත්‍යාගයක් තිබේද?

ඒ ආලෝකයට පිටුපා යාම මිනිසුන් වශයෙන් තවදුරටත් ඔබට කළ හැකි දෙයක්ද?

# සිහින ගෙනෙන කුමාරයා

ස්මාර්ට් ආර්ථියක් හදනවාලු. ස්මාර්ට් අධ්‍යාපනයක් හදනවාලු. ස්මාර්ට් සමාජයක් හදනවාලු. ස්මාර්ට් ශ්‍රී ලංකාවක් හදනවාලු. මෙහෙම කිවුවේ රනිල්ය. ඒ, එ.ජා.ප. සමුළුවේදීය. නමුත් ඒ සිහිනය සැබෑ කරන්නේ 2048දීලු.

අපිට එකක් නම් පැහැදිලිය. 2048 පිළිබඳව රනිල්ලා ජනතාවට පෙන්නේ සිහිනයක්ම පමණි. ඒ, සිහිනෙකින්වත් දකින්න අකමැති මිනිසෙකු ලෙසටය. 2048 වනතුරු මේ රට රනිල් රාජපක්ෂ පාලන ක්‍රමය තිබේද යන්නද සිහිනයකි. ඔවුන් නැතුව වුවද මේ ආර්ථික ප්‍රතිපත්තියේම ශ්‍රී ලංකාව දිගටම ගියහොත් අපට ඉතිරි වන්නේ අපට අයිති නැති රටකි. භූමිය සහ සිවුපාවා, ගහකොළ පවා අහිමි කළ සිහින දේශයක් පමණි.

මේ පට්ට හොරු ගොඩනඟන ඒ සුන්දර සිහින දේශය ගැන විශ්වාසය තබාගෙන සිටින කවුරුන් හෝ මිනිස් ජීවියෙකු මේ පොළොව මත සිටිනවා නම් අපි ඔහුට නස්රුදීන්ගෙ මේ උපහාස කථාව මතක් කර දෙමු.

එක දවසක් මහා රැයක හදිසියේ අවදි වූ නස්රුදීන් එයාගෙ බිරිඳව මහා කලබලයකින් ඇහැරෙව්වා. ඇහැරවලා හඬ නඟා මෙහෙම කිවුවා. "දුවලා ගිහින් මගේ කණ්ණාඩි දෙක ගේන්න. මං අපූරු හීනයක් දැක දැක ඉන්නේ. ඒකෙ අන්තිම කොටස ටිකක් පැහැදිලි නෑ වගේ." කියලා.

රනිල්ලා මවන හීනයේ ඉතුරු ටිකත් බලන්න ආසා අය සිටිත් නම් මේ දැන්ම ඇස් පරීක්ෂා කරගෙන කණ්ණාඩි කුට්ටමක් සූදානම් කරගෙන ජීවිතයේ අවසන් සිහිනය දකින්න සූදානම් වන්න කියා අපි ඔවුන්ට සාදරයෙන් මතක් කර සිටිමු.




# බහින කලාවේ නහින තාලය!




එන පොට හොඳ නැති බව රනිල් රාජපක්ෂ පාලනය දැනටමත් අවබෝධ කොටගෙන තිබේ. ළඟ ළඟ එන අනතුර, පාලක පංතියේ එක ඔඩොක්කුවකින් තව ඔඩොක්කුවකට වැටෙන විදියේ සරල සම්ප්‍රදායික එකක් නොවෙන බවත් එය තම පදනම් දෙදරා බිම හෙළන පංතිමය අනතුරක් බවත් ඔවුහු හොඳින්ම වටහාගෙන සිටිති. ඊට මුහුණදීමට දැනටමත් ඔවුහු ව්‍යවස්ථාමය ආයුධ ත්‍රිත්වය ලක ලැහැස්ති කරමින් සිටිති.

ඉන් එකක් නම් තමන්ට එරෙහිව ලියවෙන අත්, බැඳ දැමීම සඳහා පාවිච්චියට ගැනීම සඳහා වන සමාජ මාධ්‍ය නියාමන පනතය. අනෙක තම සැහැසි පාලනයට එරෙහිව නැගී සිටින ජනතාවට ත්‍රස්තවාදී හංවඩුව ගසා මර්දනය කිරීමේ ත්‍රස්ත විරෝධී පනතය. අනෙක තමන්ට එරෙහි නැගී සිටින කම්කරු ජනයා මර්දනය සඳහා වන නව කම්කරු නීති පනතය.

මින් කියැවෙන්නේ සමාජයේ ජනතා විරෝධී ජන පීඩක පාලනයේ අවසානය ළං ළංවත්ම පාලකයා වඩ වඩා වියරු ස්වභාවයකට පත්වන බව මිස අන් යමක් නොවේ. මේ වියරු පාලකයන්ට අපි එකක් මතක කරදෙමු. එනම් උඹලාගේ සියලුම මර්දනකාරී බර අවිවලට වඩා සංවිධානාත්මක ජනතා අරගල අවිය අති ප්‍රබල බව ඉතිහාසය පුන පුනා ඔප්පු කොට තිබේ.

අනෙක් අතට තව ඓතිහාසික ස්ථාවරයක් මේ තුළ ඔප්පු වේ. උඹලා උඹලාගේ මර්දන අවි වේගයෙන් මුවහත් කරන්නේ උඹලාගේ දේශපාලනයද ඉතාම වේගයෙන් කෙටි කලකින්ම මේ පොළොවෙන් තොලොංචි වී යන බව උඹලාට දැන් හොඳටම දැනෙමින් පවතින නිසාය. තොප විසින් කර තිබෙන ආනන්තරීය දේශපාලන පාපකර්මවලින් ගැලවීමක් අහසෙහි සිටියද පොළොවෙහි සිටියද, මුහුද මැද සිටියද බංකරයක සිටියද නැති බව සාතිශය සංවේගයෙන් යුතුව දන්වා සිටිමු.

2023 ඔක්තෝබර් 03

# ආණ්ඩුව මැතිවරණ හකුළන්නේ ජනතා විරෝධය බලහත්කාරයෙන් යටපත් කරන්නයි

*(මැතිවරණ විශේෂ විධි විධාන පනත් කෙටුම්පත පිළිබඳ විවාදයට සහභාගි වෙමින්)*



ජාතික ජන බලවේගයේ පාර්ලිමේන්තු මන්ත්‍රී
**විජිත හේරත් සහෝදරයා**

ලංකාව ආර්ථික වශයෙන් බංකොලොත් කියලා පසුගිය අවුරුද්දේ අප්‍රේල් මාසයේ 12වැනිදා පළමුවැනි වතාවට ප්‍රකාශයට පත් කළා. දැන් රට බංකොලොත් වෙලා මාස 17ක් වෙනවා. මේ බංකොලොත්කමෙන් රට මුදා ගන්න තමයි රනිල් වික්‍රමසිංහ මහත්මයා ඇතුළු අලුත් අමාත්‍ය මණ්ඩලය පත් වුණේ. හැබැයි, මාස 17න් ගත වුණත්, මේ බංකොලොත්කමෙන් තවම රට මුදාගෙන නැහැ.

**IMF එකට යන්න බලපෑ ප්‍රධාන හේතුව තමයි, අපි ගත්ත විදේශ ණය කපා හැරීම සහ ඒ සඳහා සහන ලබා ගැනීම. නමුත්, මේ වනතෙක් ඩොලර් එකකවත් ණය කපා හැරීමක් සිදුවෙලා නැහැ. ඒ වාගේම අපි ණය ගෙවිය යුතු කාල සීමා දීර්ඝ කරගෙන හෝ අපි ගෙවිය යුතු පොලියට සහන ලැබීමක් සිදුවෙලාත් නැහැ. ඒ වෙනුවට වෙලා තිබෙන්නේ, ෂඵ්ඵ එක අපට ඉදිරිපත් කරපු කොන්දේසි මත අපේ රටේ ජනතාව මත තවත් බදු පනවන්න සිදුවෙලා තිබීම, ඒ වාගේම භාණ්ඩවල මිල වැඩි කරන්න සිදුවෙලා තිබීම. ඒ අර්ථයෙන් තමයි විදුලි බිල වැඩි වුණේ; තෙල් මිල වැඩි වුණේ; ගෑස් මිල වැඩි වුණේ; ජල ගාස්තු වැඩි වුණේ.**

IMF එක පළමුවැනි සමාලෝචනය ඉවර වෙලා ඉතා පැහැදිලිව කිවුවා, "බදු ආදායම මදි. අපේක්ෂිත ආදායම සියයට 15%ක් ලැබිලා නැහැ. තවත් බදු වැඩි කරන්න. බදු ආදායම ලබා ගත්තේ නැත්නම් තවත් අමාරුවේ වැටෙනවා" කියලා. ඒ නිසා දැන් ආණ්ඩුව බදු පිට බදු ගහනවා. ලබන ජනවාරි මාසයේ ඉඳලා අවුරුදු 18ට වැඩි සියලු දෙනාට බදු ෆයිල් එකකුත් open වෙනවා. මේ වන විට හදිසියේ තෙල් මිලත් වැඩි කරලා තිබෙනවා. ආණ්ඩුව පාරම්බෑවා, දැන් උද්ධමනය අඩුයි, සියයට 1.6යි කියලා. ගිය අවුරුද්දේ උද්ධමනය සියයට 70ට තිබෙනකොට පෙට්‍රල් ලීටරයක මිල තිබුණේ 117ට බව අපට මතකයි. අද උද්ධමනය සියයට 1.6යි කියනවා. හැබැයි, පෙට්‍රල් ලීටරයක මිල රුපියල් 361ට වැඩිවෙලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. එදා ඩීසල් ලීටරයක මිල රුපියල් 105යි. ඊට පස්සේ ඩීසල් ලීටරයක මිල රුපියල් 341ට වැඩි වුණා. ඊයෙ-පෙරේදා ඩීසල් ලීටරයක මිල රුපියල් 351ට වැඩි කළා. එදා උද්ධමනය සියයට 70යි කියනකොට ලාම්පු තෙල් ලීටරයක මිල රුපියල් 87යි. දැන් ආණ්ඩුව පාරම්බානවා. උද්ධමනය අඩුයි. සියයට 1.6යි කියලා. හැබැයි, දැන් ලාම්පුතෙල් ලීටරයක මිල රුපියල් 241යි. තුන් ගුණයකින් - සියයට 330කින් - වැඩි වෙලා තිබෙනවා. දැන් තෙල් පෝලිම් නැහැ. ගෑස් පෝලිම් නැහැ. ආර්ථිකය හොඳයි කියලා මතුපිටින් පෙන්වන්න හැදුවාට දැන් අප සතුව තිබුණු තෙල් කොම්පැනි ටිකත් නැති වෙලා. අද තෙල් සමාගම් තරගෙට තෙල් මිල වැඩි කරනවා.

ප්‍රතිව්‍යුහගත කරනවා කියලා ආයතන විකුණා දැමීම ඇතුළේ අපේ රටේ තිබෙන ආර්ථිකයත් කඩා වැටෙනවා. ඊයේ මිල්කෝ ආයතනයට ලියුමක් ආවා. ඒ ඇවර කිරීමේ ලිපිය. දැන් මිල්කෝ ආයතනය සම්පූර්ණයෙන්ම ඉන්දියානු සමාගමකට පවරා දෙන්න ලැහැස්ති වෙනවා. ඒ විතරක් නොවෙයි. අද වෙනකොට සතොස සේවකයින් සිය ගණනක් මහ පාරේ උපවාසවල නිරත වෙලා ඉන්නවා. සතොස තමයි ව්‍යසන අවස්ථාවකදී, ආපදා අවස්ථාවකදී රටේ ජනතාවට සහන මිලට බඩු ටික සපයා දෙන්න තිබුණු ආයතනය. බන්දුල ගුණවර්ධන හිටපු වෙළඳ ඇමතිවරයා අවස්ථා කිහිපයකදී කිවුවා, කොරෝනා ව්‍යසන කාලයේ, ගංවතුර කාලයේ, සුනාමි කාලයේ ගෙවල්වලට ගිහිල්ලා පරිප්පු, සීනි ඇතුළු අත්‍යාවශ්‍ය භාණ්ඩ ටික බෙදන යන්ත්‍රණයක් ක්‍රියාත්මක වුණේ සතොස හරහා බව. මේ ආණ්ඩුව ආවාට පස්සේ IMF පදයට නටලා සතොස ආයතනය මුළුමනින්ම විකුණලා අද එහි සේවකයින් ටික මහපාරට වට්ටලා තිබෙන්නේ. අද ඒ සේවකයින් අඛණ්ඩ උපවාසයක නිරත වෙලා ඉන්නවා. මේ අය සේවයෙන් ඉවත් වෙනකොට අඩුම ගණනේ සාධාරණ පදනමක් මතවත් ඔවුන්ට අදාළ දීමනා ලබා දුන්නේ නැහැ. සතොස ආයතනය විනාශ කරපු එක ගැන ඔවුන් විවිධ අවස්ථාවලදී කථා කළා. සතොස ආයතනය විනාශ වුණේ සේවකයින්ගේ වැරැද්දෙන් නොවෙයි, දේශපාලන මැදිහත්වීම්වලින්. දේශපාලන මැදිහත්වීම්වලින් සතොස ආයතනය මුළුමනින්ම කඩා වට්ටලා. ඒ ආයතනය සතුව තිබුණු ලොරි ඇතුළු දේපළ ටික ලංකා සතොසට දීලා -පෞද්ගලික ආයතනයට පවරලා- අද ඒ සේවකයින් ටික මහ පාරට ඇද වට්ටලා ආණ්ඩුව වගේ වගක් නැතිව ඉන්නවා. ඒ ගැන කථා කරන්නේත් නැහැ.

ඒ විධියටම මේ රටේ දහස් ගණන් ජනතාව විදුලි බිල වැඩි කිරීම නිසා, තෙල් මිල වැඩි කිරීම නිසා අද පීඩා විඳිනවා. තෙල් මිල වැඩි කළාම බස් ගාස්තු වැඩිවෙනවා. දුම්රිය ගාස්තු වැඩි වෙනවා; කර්මාන්ත නැවත වතාවක් කඩා වැටෙනවා. මේ වසරේ පළමුවැනි කාර්තුවේ කර්මාන්ත ක්ෂේත්‍රය ඍණ 23කින් කඩා වැටිලා තිබෙනවා. ඉදිරියේදී කර්මාන්ත අංශය තවත් කඩා වැටෙනවා. මේ තෙල් මිල වැඩිවීමත්. විදුලි බිල වැඩිවීමත් එක්ක.

හැබැයි IMF එක ඉතා පැහැදිලිව ඔවුන්ගේ වාර්තාවේ ඉදිරිපත් කළා, මේ ආර්ථිකය මේ සා විශාල වූ අගාධයකට වැටෙන්න ප්‍රධාන වශයෙන් බලපෑ හේතුව වන්නේ, වංචා, දූෂණ නතර නොකිරීම, වංචා, දූෂණ තව තවත් පැටව් ගහලා වර්ධනය වීමයි කියන කාරණය. අපි පාර්ලිමේන්තුවට පනත් ගෙනෙනවා. හැබැයි, වැඩක් නැහැ. වංචා, දූෂණ නතර වෙන්නේ නැහැ. ලොකුම විහිළුව මෙයයි. අද මැතිවරණ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පතත් ඉදිරිපත් කර තිබෙනවා, සම්මත කරගන්න. හැබැයි, මැතිවරණයක් නැහැ. මැතිවරණ වෙනුවෙන් පනත් එනවා. හැබැයි, මැතිවරණ නැහැ. දූෂණ, වංචා පිළිබඳ පනත් එනවා. හැබැයි, දූෂණ, වංචා නතර වෙන්නේ නැහැ. ඒ විතරක්ද? නීතිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පනත් ගේනවා. හැබැයි නීතිය ක්‍රියාත්මක වෙන්නේ නැහැ, නීතිය වල් වැදිලා.

අධිකරණයෙන් මොන තීන්දු දුන්නත් වැඩක් නැහැ. ඒවා නොවෙයි වලංගු. පාර්ලිමේන්තුවෙන් දෙන තීන්දුව තමයි වලංගු කියලා ඉතා සාහසිකව ප්‍රකාශ කළා. ඒක අධිකරණයට කරපු සාහසික බලපෑමක්. අධිකරණයට ඍජුව කරපු බලපෑමක්. ඊට පසසේ ඒ නඩු විභාගය සම්බන්ධයෙන් කථානායකවරයා මේ පාර්ලිමේන්තුවේ නැවත ප්‍රකාශයක් කරමින් අධිකරණයට වක්‍රව බලපාන ක්‍රියාමාර්ගයක් ගත්තා. එවැනි ක්‍රියාමාර්ග මගින් තමයි අද විනිශ්චයකාරවරුන්ට ඉල්ලා අස්වෙන්න සිද්ධ වෙලා තිබෙන්නේ. සමහර මන්ත්‍රීවරු උසාවියේ විභාග වෙමින් පවතින නඩු පිළිබඳව, විනිශ්චයකාරවරු පිළිබඳව යම් යම් තැන්වල කථා කරමින් කරපු බලපෑම් නිසා තමයි මෑත ඉතිහාසයේ පළමුවෙනි වතාවට විනිශ්චයකාරවරුන්ට ඉල්ලා අස්වෙන්න, රට දමා යන්න සිද්ධ වෙලා තිබෙන්නේ. ඒ නිසා අද ඉතා පැහැදිලිව පේන්න තිබෙන දෙයක් තමයි. මේ ආණ්ඩුව ජනතාවගේ ප්‍රශ්න විසඳන්න සමත් නොවන නිසා ජනතාවගේ ඡන්දවලට බය වෙලා මැතිවරණ හකුළමින් මර්දනකාරී ක්‍රියාමාර්ග ගන්නවාය කියන කාරණය. මැතිවරණයක් නැතුව මැතිවරණ සම්බන්ධයෙන් තිබෙන දඩ මුදල් වැඩි කරනවා. ඒ වාගේම ඡන්ද පෙත්සම් ඉදිරිපත් කරන්න තිබූ දින 21ක කාලය දින 42ක් කරනවා. ඉතින්, දින 42ක් කරලා වැඩක් තිබෙනවාද, මැතිවරණයක් නැත්නම්? පළාත් සභා මැතිවරණයත් නැහැ. පළාත් පාලන මැතිවරණයත් නැහැ. හැබැයි, මැතිවරණ පනත් විතරක් තිබෙනවා.

ඊළඟ කාරණය තමයි, මැතිවරණ පවත්වන්න ආණ්ඩුවට මුදල් නැහැ කියලා කරපු වංචාව; මුදල් නැහැ කියලා මැතිවරණ කල් දමපු එක. ඕනෑම පොඩි ළමයෙකුට තේරෙනවා, මේක පට්ටපල් බොරුවක් කියලා. අද මැතිවරණ හකුළා තිබෙනවා; ප්‍රජාතන්ත්‍රවාදය හකුළා තිබෙනවා. ඒ වාගේම සමාජ මාධ්‍ය මර්දනය කරන්න, දඩයම් කරන්න ගෙනෙන Online Safety Bill එක මගින් තවදුරටත් ප්‍රජාතන්ත්‍රවාදය හකුළනවා. අනෙක් පැත්තෙන්, ත්‍රස්ත විරෝධී පනත ගෙනැල්ලා ප්‍රජාතන්ත්‍රවාදය හකුළනවා. ආණ්ඩුවේ බැරිකම වහගන්න මැතිවරණ කල් දමනවා; සමාජ මාධ්‍ය මර්දනය කරනවා. ඒ විතරක් නොවෙයි. මේ ආණ්ඩුවේ ක්‍රියාමාර්ගවලට එරෙහිව ජනතාව නැගිටින එක පාලනය කරන්න. වළක්වන්න, ඒ අය දඩයම් කරන්න ත්‍රස්ත විරෝධී පනත වැනි ඒවා ගේනවා.

මේ කාරණා තුනෙන්ම පේන්නේ මොකක්ද? ආණ්ඩුව ජනතාවගේ ප්‍රශ්න විසඳන්නේ නැතුව, ජනතාව මත බදු පිට බදු ගහලා, තෙල් මිල, විදුලි බිල, වැඩි කරලා ජනතාවට ජීවත් වෙන්න බැරි තත්වයක් ඇති කළාම, ජනතාවගෙන් බුර බුරා නැගෙන විරෝධය බලහත්කාරයෙන් යටපත් කරන්න මැතිවරණ හකුළනවා. ඒ වාගේම සමාජ මාධ්‍ය මර්දනය කරන පනත් ගේනවා. ත්‍රස්ත විරෝධී පනත වැනි ඒවා ගේනවා. හැබැයි, මේ මොන පනතක් ගෙනාවත් වැඩක් නැහැ. මේ රටේ ජනතාව දන්නවා, අත්දකිනවා, අද රටේ තිබෙන ඇත්ත තත්වය. මේ රටේ තිබෙන ආර්ථික අර්බුදයෙන් අපි ගොඩ ගිහිල්ලාත් නැහැ. ප්‍රජාතන්ත්‍රවාදය වාගේම අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා වෙලාත් නැහැ. ඒ නිසා අපි අධිකරණය පිළබඳව නීති, පනත් කොච්චර සම්මත කළත් වැඩක් නැහැ; මැතිවරණය පිළිබඳව නීති, අණ පනත් කොච්චර සම්මත කළත් වැඩක් නැහැ; වංචා, දූෂණ වැළැක්වීම පිළිබඳව නීති කොච්චර සම්මත කළත් වැඩක් නැහැ; ඒ එකක්වත් මහ පොළොවේ ක්‍රියාත්මක වෙන්නේ නැති නිසා. ඒ නිසා තමයි IMF එක කියලා තිබෙන්නේ මෙය යථාර්ථයක් වෙන්නේ "if implemented effectively" කියලා. එහෙම නොවුණොත් සාධාරණයක් ඉෂ්ට වෙන්නේ නැහැ.

## NPPයේ ජනප්‍රසාදය ඉහළට...

01 පිටුවෙන්

ජනතාව මත පැටවීම හේතුවෙන් පීඩාවට පත්ව සිටින අති මහත් ජනතාව ජාතික ජන බලවේගය වටා විශ්වාසයෙන් බැඳෙමින් සිටීම ආණ්ඩුවට හා සාම්ප්‍රදායික විපක්ෂයට නොදැනෙන්නට හේතුවක් නොමැති බවය. "ජනතාව ඉන්නේ අපිත් එක්ක. හතුරන්ගේ වියරුව අපිට තේරුම් ගන්න පුළුවන්. ඔවුන්ගේ මඩ අවලාදවලින් අපි සැලෙන්නෙත් නැහැ. මිනිස්සු ඒවා ගණන් ගන්නෙත් නැහැ. ලබන වසරේ මේ දුෂ්ට පාලනය පෙරළා දමා ජනතාවාදී ආණ්ඩුවක් බිහිවෙනවා. මිනිස්සු තමන් විඳින පීඩාව යම් තරමකට හරි දරාගෙන ඉන්නේ ඒ අධිෂ්ඨානයෙන්. ඒක වළක්වන්න මේ කාටවත් බැහැ." ටිල්වින් සිල්වා සහෝදරයා අවධාරණය කළේය.

## ඡන්දෙට අටවන...

03 පිටුවෙන්

ජනාධිපතිවරණයෙන්ද පරාජය වීමටය.

ඒ අනුව ලබන වසරේ අනිවාර්යයෙන්ම ආණ්ඩුවේ බලය මාරුවන ඡන්දයක් පැවැත්වීමට සිදුවේ. එබැවින් වසර 2ක් ඡන්ද නැතැයි කීම මනෝරාජික විකාරයකි; ස්වයං මෝහනයට පත්වීමකි. අවසානය ඉතා පැහැදිලිය. ආණ්ඩුව ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම ජයගන්නේ නම් ඒ සමග මහ මැතිවරණය පැවැත්වෙන අතර එසේ නොවන්නේ නම් ජනමතවිචාරණයද පරාජය වී ජනාධිපතිවරණය පැවැත්වීමට සිදුවන්නේය. මේ තත්වය තුළ විධායක ජනාධිපති ක්‍රමය අහෝසිකිරීමට අටවන උගුල් ඔවුන්ටම පාරාවළල්ලක් වනු ඇත. සමහර විට මේ සියලු තර්ක විතර්ක මැද කිසිවක් සිදුනොවීම ජනාධිපතිවරණය පැවැත්වීමට සිදුවනු ඇත. බොහෝවිට සිදුවිය හැක්කේ මේ තර්ක විතර්ක මැද ජනාධිපතිවරණය පැවැත්වීමට සිදුවීමය. එබැවින් අපේ වගකීම වන්නේ ලබන වසරේ කුමන හෝ ඡන්දයක් පැමිණෙන නිසා එය ජයගැනීමට බලවේග සූදානම් කිරීමය.

# නියමුවා

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත

464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com




පලස්තීන ජනතාවගේ වේදනාව බෙදාගනිමින්...



ශ්‍රී ලංකාවේ එක්සත් ජනපද තානාපතිනිය හමුවී...



Online පනතට එරෙහිව අධිකරණයට



පරිසර පද්ධතිය රැකගැනීම වෙනුවෙන්...



විදුලි බිල වැඩිකිරීමට එරෙහිව...



ජල සම්පත විකිණීමට එරෙහිව හඬ නගා...

# ලෝකයත් සමග පෙරට යන පාලනයක් ගෙන එනවා



ජාතික ජන බලවේගයේ නායක
අනුර කුමාර දිසානායක
සහෝදරයා

ජාතික ජන බලවේගය මහජනයාගේ සෑම සතයක්ම පෙරළා නැවත මහජන සේවය වෙනුවෙන් යොදවන දේශපාලන සංස්කෘතියක් සහ ලෝකයත් සමග පෙරට යන පාලනයක් රටට ගෙන එන බව ප්‍රකාශ කළ ජාතික ජන බලවේග යේ නායක අනුර කුමාර දිසානායක සහෝදරයා, ආණ්ඩුව එයට බිය වී සිටින බවත් මැතිවරණ නොපවත්වා කට්ටි පනිමින් සිටින්නේ ඒ නිසා බවත් අවධාරණය කළේය.

අනුර කුමාර දිසානායක සහෝදරයා මේ බව පැවසුවේ පසුගිය 21වැනි දින පැවති ජාතික ජන බලවේගයේ ගම්පොල ආසන සමුළුව අමතමිනි. මෙහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ අනුර සහෝදරයා සමුළුව අමතමින් මෙසේද කියා සිටියේය.

"ජාතික ජන බලවේගයේ ආසන සමුළු 90%ක් පමණ රට පුරා පවත්වා අවසන්. ඒ වගේම වැඩකරන ජනතාව වෘත්තීය සමිති සමුළු පවත්වමින් ඒකරාශී කර ගෙන යනවා. ගොවි ජනතාවගේ සමුළු, තරුණ සංගමයේ අලුත් දේශපාලන සාකච්ඡා, විශ්‍රාමික ත්‍රිවිධ හමුදා සාමූහිකය ඇතුළුව විවිධ වෘත්තිකයන් සංවිධානය කරමින් ව්‍යාපාරිකයන් සහ කර්මාන්තකරුවන් සංවිධානය කරමින් යනවා. ඒ වගේම දෙසැම්බර් අවසන් වන විට අප රටේ දැවැන්තම කාන්තා එකතුවත් නිර්මාණය කරනවා. මේ විදිහට සංවිධානය කරමින් මේ රටේ බලය හුවමාරු කර ගන්න අපි සූදානම් වෙනවා. අනෙක් පාර්ශ්වයේ අය ජනතාවගෙන් කොල්ලකා ගත් ඒ ධනය ඔවුන්ගේ මැතිවරණ වෙනුවෙන් පොම්ප කරනවා. ගමේ ජනතාවට සල්ලි දීලා රවට්ටලා ඡන්ද ගන්න සූදුව හැමදාම කරන්න ඒ ගොල්ලන් හිතාගෙන ඉන්නවා. ඔවුන් කුප්‍රකට ජාවාරම්කරුවන්ගේ ධනය එකතු කරන කොට අපි ජනතාව එකතු කරමින් යනවා.

පසුගිය අවුරුදු 20 තුළ ලෝකය මහා ජයග්‍රහණ අත්පත් කරගෙන තිබෙනවා. අපේ පාලකයෝ ඒ කාලය තුළ අපේ රට පස්සට ගෙනගියා. මේ මජර, කැත, සාම්ප්‍රදායික, ගතානුගතික, දේශපාලනය වෙනස් කර, නූතන රාජ්‍යයක් අපි නිර්මාණය කරනවා. සරලභාවය අපේ දේශපාලන සංස්කෘතිය වෙන්න ඕනෑ. ඇහුම්කන් දීම, නීතියට ගරු කිරීම, අපේ සංස්කෘතියක් වෙන්න ඕනෑ. මහජනයාගේ සෑම සතයක්ම පෙරළා නැවත මහජන සේවය වෙනුවෙන් යොදවන දේශපාලන සංස්කෘතියක් ඕනෑ. ජාතික ජන බලවේග යෙන් ගොඩනගන්නේ ජාතික සමගිය ආරක්ෂා කරන පාලනයක්. ඒ වෙනුවෙන් අපි සියලු දෙනාම සංවිධානය වී ශක්තිමත්ව පෙරට එන ලෙස ඉල්ලා සිටිනවා.

# දුෂ්ට පාලනය ලබන වසරේ අවසන් කරන බවට සහතික වෙනවා

ජනතා විමුක්ති පෙරමුණේ
ප්‍රධාන ලේකම්
ටිල්වින් සිල්වා සහෝදරයා



එළඹෙන වසරේ ජනාධිපතිවරණය නිසැක ලෙසම පැවැත්විය යුතු බවත් දේශපාලන කුමන්ත්‍රණ මගින් අනීතිකව, ජනතා විරෝධීව පාලන බලය රැකගැනීමට ආණ්ඩුවට හැකියාවක් නොමැති බවත් අවධාරණය කළ ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා, වත්මන් දුෂ්ට පාලනය එළඹෙන වසරේ අවසන් කරන බවට සහතික වන බව ප්‍රකාශ කළේය.

ටිල්වින් සිල්වා සහෝදරයා මේ බව ප්‍රකාශ කළේ පසුගිය 16වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පවත්වන ලද ජාතික ජන බලවේගයේ මාධ්‍ය හමුවකදීය. ආණ්ඩුව එළඹෙන වසරේ මැතිවරණයක් නොමැති බවට සමාජය තුළ මතයක් තහවුරු කිරීමට උත්සාහ දරන බවට චෝදනා කළ ටිල්වින් සිල්වා සහෝදරයා, ආණ්ඩුව එසේ කරන්නේ මැතිවරණයක් පැවැත්වුවහොත් ඔවුන් පරාජය වන බව දන්නා නිසා යැයි පෙන්වා දුන්නේය. මෙහිදී වැඩිදුරටත් අදහස් පළ කළ ටිල්වින් සහෝදරයා මෙසේද පැවසීය.

"මහින්ද රාජපක්ෂලා බලය ලැබුණු සෑම අවස්ථාවකම කටයුතු කර තිබෙන්නේ විධායක බලතල අහෝසි කිරීමට නොවෙයි, ඒ බලතල වැඩිකර ගැනීමටයි. එසේ කටයුතු කළ මහින්ද රාජපක්ෂලා මේ හදිසියේ විධායක ක්‍රමය අහෝසි කිරීමට කටයුතු කරන්නේ ඇයි? ඊළඟ ජනාධිපතිවරණයේදී රාජපක්ෂලා ඇප නැතිව පරදිනවා. ඔවුන්ට ජනාධිපතිවරණයට ඉදිරිපත් කිරීමට අපේක්ෂකයෙක් වත් නැහැ. විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමට සංශෝධනයක් ගෙන ආවොත් ඒ සංශෝධනය සම්මත වෙනකොටම මේ පාර්ලිමේන්තුව විසිරවීමේ යෝජනාවක්ද තිබෙන්න ඕනෑ. ඒ එක්කම මහජන ඡන්දයෙන් අලුත් පාර්ලිමේන්තුවක් ගොඩනැගෙන්න ඕනෑ. විධායක බලතල පැවරෙන්න ඕනෑකම තිබෙන්නේ මහජන ඡන්දයෙන් තේරී පත්වුණු ජනවරමක් සහිත පාර්ලිමේන්තුවටයි."

# එළඹ ඇති අවස්ථාව ජනතාවාදී ජයග්‍රහණයකින් කෙළවර කිරීමට කැපවෙමු



සමාජවාදී තරුණ සංගමයේ ජාතික
සංවිධායක
එරංග ගුණසේකර සහෝදරයා

ඉතිහාසයේ කවරදාටත් වඩා වර්තමානයේදී සුවිශේෂී අවස්ථාවක් එළඹ තිබෙන බවත් පොදු ජනතාවට සාමාන්‍ය ලෙසට ජීවත් වීමට නොහැකි තත්වයක් උදාවී තිබෙන බවත් එසේම පාලකයන්ටත් සුරපුරුදු ලෙස රට පාලනය කිරීමට නොහැකි වී තිබෙන බවත් පෙන්වා දුන් සමාජවාදී තරුණ සංගමයේ එරංග ගුණසේකර සහෝදරයා, එළඹ ඇති අවස්ථාව ජනතාවාදී ජයග්‍රහණයකින් කෙළවර කිරීමට කැපවෙමු යැයි ප්‍රකාශ කළේය.

එරංග ගුණසේකර සහෝදරයා මේ බව පැවසුවේ පසුගිය 08වැනි දින විහාර මහාදේවි එළිමහන් රංග පීඨයේ පැවති 'චේ සමරුව' අමතමිනි. වැඩිදුරටත් අදහස් දක්වමින් එරංග සහෝදරයා මෙසේද පැවසීය.

"ආණ්ඩුව මැතිවරණ කල්දමා මර්දන නීති, අනපනත් ගෙනෙනවා. නමුත් ඉතිහාසයේ එළඹී තිබෙන මේ අවස්ථාව අපි හරියට තේරුම් ගන්න ඕනෑ. මේ අවස්ථාව ජනතාවාදී ජයග්‍රහණයකින් කෙළවර කරන්න කැපවීමෙන් ක්‍රියාකරන්න ඕනෑ. චේ සහෝදරයා තවදුරටත් ළංකර ගන්න ඕනෑ ඒ නිසයි. අවුරුදු ගණනකට ඉස්සර චේ සහෝදරයා කියා තිබෙනවා "විප්ලවය කියන්නේ ඉදී වැටෙන ඇපල් ගෙඩියක් නොවෙයි. අප සෑම මැදිහත් වී එය කඩාගත යුතුයි." යනුවෙන්. චේ සහෝදරයා සමරන මේ වෙලාවේදී අපි කියනවා අපි ස්මාර්ට් විදිහට ඇපල් ගෙඩිය කඩාගෙන ජයග්‍රහණයෙන් අවසන් කරමු කියලා. එළඹී තිබෙන මේ වෙලාව අත්හැරීමට අපි කිසිවෙකුටත් අයිතියක් නැහැ. ඒ වගේම මේ අවස්ථාව වරද්දා ගැනීමට අයිතියකුත් නැහැ. ස්මාර්ට් ලෙස අපි මේ මැච් එක ගහනවා. මේ මැච් එක අපෙයි. මේ ජයග්‍රහණය අපේ."





බත්තරමුල්ල, පැලවත්ත, පන්නිපිටිය පාරේ 464/20 හි පදිංචි එම්.ටිල්වින් සිල්වා වන මා විසින් අංක 43/20, නුගගහ පෙදෙස, පිළියන්දල පාර, මහරගම පිහිටි නියමුවා ප්‍රකාශන ආයතනයේ මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.